HNB GRAMEEN
මෙහෙවර
අඳුර දුරලන සොඳුරු මෙහෙවර
4 කාණ්ඩය - තෙවන කලාපය - 2015 නොවැම්බර්

අන්තර් ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ක්‍රිකට් තරගාවලියෙ

පළඟ ශූරතාවය එච් එන් බී ග්‍රාමින් සමාගමට

ලංකා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සපයන්නන්ගේ ආයතන සංගමය මගින් සංවිධානය කරන ලද සය සාමාජික ක්‍රිකට් තරගාවලිය 2015 ඔක්තෝබර් මස 10 වන දින කොළඹ 05, ශාලිකා ක්‍රීඩාංගණයේදී අති උත්කර්ෂවත් ලෙස පවත්වන ලදී.

ශ්‍රී ලංකා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සපයන්නන්ගේ ආයතන සංගමයේ සාමාජිකත්වය ලබා ඇති ආයතන 25 ක් මෙම තරගාවලිය සඳහා තරග වැදුණු අතර එච් එන් බී ග්‍රාමීන් සමාගමේ ඒකාබද්ධ කණ්ඩායම සහ පුත්තලම ශාඛා කණ්ඩායම යන කණ්ඩායම් දෙකම මෙම තරගාවලිය සඳහා ඉදිරිපත් විය. තරඟාවලියේදී "පළඟ ශූරතාවය" සඳහා එච් එන් බී ග්‍රාමින් ඒකාබද්ධ කණ්ඩායම සමග තරග වැදුණු විෂන් ෆන්ඩ් සමාගම පරදවා HNB ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් ඒකාබද්ධ කණ්ඩායම "පළඟ ශූරතාවය" දිනා ගැනීමට සමත් විය.



ජීවිතයේ බොහෝ දේවල් මිනිසුන් බලාපොරොත්තු වුවත් එම බලාපොරොත්තු මල්ලෙන් සැබෑ කරගන්නා බලාපොරොත්තූන් ඉතා අඩුය. එම බලාපොරොත්තු ඔබ සිතේ සිහින සිතුවම් ලෙස පවතී. මෙම සිහින ඉබේ සැබෑවන්නේ නැත. එම සිහින සැබෑ කරගැනීමට කැපකිරීම් කළ යුතුය.එසේම විවිධ අභියෝග වලට පවා මුහුණ දීමට සිදුවේ. ඔබ ආශා කරන හා කැමති දේවල් විකිණීමට ඇති තැන් වලින් මිලට ගත හැකියි.

එනම් සවර්ණාභරණ, ඇඳුම්, ඉඩම්, වාහන ආදිය ඔබට මිළදී ගතහැකි නමුත් ඔබට අවශ්‍ය වුවත් විකිණීමට තබා නොමැති, මිලකළ නොහැකි දේවල්ද පවති. එනම් ආදරය, කරුණාව, මෛත්‍රිය, සිහින, සබඳතා, සතුට,අවංක යහළු මිත්‍රාදීන් එසේ මුදලට ලබාගත නොහැකිය. අප ජීවිත සාර්ථක කර ගැනීමට මෙම වර්ග දෙකම අත්‍යවශ්‍ය බව අපට වටහා ගත හැක.

ඔබ තුළ කොපමණ දක්‍ෂතා හා හැකියාවන් පැවතුනත් එම දක්‍ෂතා හා හැකියාවන් දැක ඔබව යමෙකු දිරිමත් කිරිමක් හෝ අදාල තැන්වලට යොමු කිරිමක් කළ යුතුය. එසේ දිරිමත් කිරීමක් හෝ යොමුකිරිමක් නොවුනේ නම් දක්‍ෂයාට කිසිදු දිනක දක්‍ෂතාවන්ගෙන් ප්‍රයෝජන ගැනිමට ඉඩකඩක් නොලැබේ. ඔබත් ඔබ ගැන සිතා බලන්න, ඔබ දක්‍ෂයකු නම් ඔබට කිසිදා සැඟව සිටිය නොහැක. ඔබව ලෝකය හඳුනාගෙන වටිනා කමක් ලබාදේ. වටිනාකම ඔබ බලෙන් ලබා ගැනිමට අවශ්‍ය නැත. ලෝකයම එම වටිනාකම ලබාදෙනවා ඇත.

අති විශිෂ්ටයෙකු වීම සඳහා නිරතුරුවම ඔබගේ හැකියාවන්, දක්ෂතා හා විනෝදාංශ ගැන අවධානය යොමු කරන්න. ඒවා එකින් එක ක්‍රියාත්මක කරන්න. එයින් ඔබට ජීවිතයේ සාර්ථකත්ව මාවත හදුනාගැනීමට හැකිවෙනවා නොඅනුමානය.

ලොවම දිනූ ගායකයකු වූ කරණවෑමියා

ඉන්දියවේ ඈත ගමක එතරම් අධ්‍යාපනය නොලැබූ තරුණයෙක් විය. ඔහුගේ නම මොහොමඩ්ය. මෙම තරුණයාගේ වෘත්තිය වුයේ කොණ්ඩා කැපීමයි. ඔහු අන් අයගේ කොණ්ඩය කැපීමේදි එය කරදරයක් ලෙස නොසලකා තම පාරිභෝගිකයාව උපරිම තෘප්තියට පත් කරමින් සේවාව ලබා දෙන ලදි. ඔහුගේ දින චර්යාවේ සුවිශේෂි බව වුයේ පාරිභෝගිකයාගේ කොන්ඩය කපන අවස්ථාවේ ඔහු සිහින් හඬින් ගීත මුමුණමින් තම රාජකාරිය සිදු කිරීමයි. එමගින් ඔහුද ප්‍රීතියෙන් තම රාජකාරිය සිදු කරන අතර පාරිභෝගිකයාද ඉන් යම් මානසික සුවයක් ලබයි. එවැනි අය වෙත නැවත නැවත පැමිණීමට පාරිභෝගිකයාද වැඩි රුචියක් දැක්වීම පුදුමයක් නොවේ. දිනක් අළුත්ම පාරිභෝගිකයෙකු මොහොමඩ් වෙතට පැමිණියේ කොන්ඩය කපා ගැනීම පිණිසය. එම පාරිභෝගිකයා හමුවේද තම පිළිවෙත වෙනස් නොකළ මොහොමඩ් ගීයක් රසට මුමුණමින් කොන්ඩය සැකසීම සිදු කරන ලදි. කොන්ඩය කපා අවසානයේ ගනුදෙනුකරුවා මොහොතක් මොහොමඩ් සමඟ දොඩමළු විය. එහිදි ගනුදෙනුකරු ඔහුව හදුන්වා දුන්නේ තමා ඉන්දියානු ගුවන් විදුලි ආයතනයේ ප්‍රධානියෙකු බවත් මොහොමඩ්ගේ මිහිරි කටහඬ ඇසීමෙන් තමා ඉතා සතුටට පත්වූ බවත් කියමිනි. ආගන්තුක ගනුදෙනුකරුවා එදින නික්මී ගියේ තම ලිපිනය මොහොමඩ්ට ලබාදෙමින් ඉක්මණින් පැමිණ තමා හමුවන ලෙසත් දන්වා සිටිමිනි. ලැබුණු අවස්ථාව පැහැර නොහැරිය මොහොමඩ් ලද ඇසිල්ලකින් ගුවන් විදුලි සංස්ථාව වෙත ගොස් තම ආගන්තුක ගනුදෙනුකරුවාව මුණ ගැසුණෝය. එහිදී මොහොමඩ්ට කටහඬ පරික්ෂණයකට පෙනීසිටීමේ භාග්‍ය උදා විය. එම කටහඬ පරීක්ෂණයෙන් ඔහු ඉතා ඉහලින් සමත් වී තිබිණි. එය ඔහුට සේම ඔහුගේ පවුලේ අන්‍යන්ටද සතුටු ආරංචියක් විය.

එම සතුටු ආරංචියත් සමඟ ඔහුගේ ජීවිත ගමනේ වෙනස්කම් රාශියක් සිදුවුනි. එනම් ඔහුට ගුවන් විදුලියේ ගීත ගායනයට ඉඩ ප්‍රස්ථා උදා වුනි. කාලයත් හා සමඟ ක්‍රමයෙන් මොහොමඩ් ප්‍රසිද්ධ ගායකයකුගේ තත්වයට පත්විය.ඔහු ගැයූ සෑම ගීතයක්ම පාහේ අතිශය ජනාදරයට පාත්‍රවිය. අවසානයේ ඉන්දියාවේ පමණක් නොව මුළු ලෝකයේම සුප්‍රසිද්ධ පුද්ගලයෙකු බවට පත්විය. අදවන විට ඔහු මියගොස් තිබුණද හෙට බිහිවන පරපුරේද ජනාදරයට පාත්‍රවන තරමේ ඔහුගේ නාමය නොමියෙන නාමයක් බවට පත්කර හමාරය. ඔහු අන් කවරකුවත් නොව ලෝකප්‍රකට ගායන ශිල්පියකු වූ මොහොමඩ් රාෆිය. මොහොමඩ් යන නම අපට ප්‍රසිද්ධ නාමයක් නොවුවත් මොහොමඩ් රාෆි යන නාමය ලෝක පූජිත නාමයකි. මෙම ලෝක පූජිත මොහොමඩ් රාෆිගේ ඉතා සුන්දර ගීත ඔබ අද සේම හෙටද රසවිදිනවා නොඅනුමානය.

මෙලෙස ඔහු ඔහුගේ ජීවිත ගමන් මාර්ගය සම්පූර්ණයෙන්ම වෙනස්කර ගනු ලැබුවේ තම නිසඟ හැකියාවන් තම රැකියාව කරන අතරතුර හෝ අන් අයට ඇසීමට සැලැස්වීමෙනි. ඔබත් මේ මොහොතේ සිටම අද සිටම ඔබ නිසැඟ හැකියාවන් මොනවාදැයි හදුනා ගන්න. හදුනාගත් එම හැකියාවන් පැත්තකට කර නොතබා එදිනෙදා ජීවිතයට භාවිතා කරන්න. ඔබගේ එම නිසඟ හැකියාවන් අන් අය හදුනාගන්නවා නොඅනුමානය. එම නිසග හැකියාවන් ඔප්නංවා ගැනිමෙන් ඔබට ඔබගේ ජීවිතය සුවිශේෂි වු මානයක් කරා රැගෙන යාමට හැකිවෙනවා ඇත. මේ දැන් පටන් ඔබගේ ජීවිතය වෙනස්කර ගනිමින් නව ජීවිත ඉලක්කයක් කරා ගමන් කිරීමට සැලසුම් කරගන්න. ක්‍රියාත්මක කරන්න. පසුවිපරමක් සිදු කරන්න. එමගින් ඔබේ වටිනා ජීවිතයට සශ්‍රීකත්වය ලං කරගන්න. අවසානයේ එහි ප්‍රතිඵලය ඔබ පවුලට , ගමට, රටට, ලෝකයටම ඉතා යහපත් තත්වයක් උදාකරනවා නොඅනුමානය. මේ මොහොතේ සිට ඔබ දක්ෂතා හැකියාවන්, විනෝදාංශයන් හදුනාගන්න. ඒවා ප්‍රගුණ කරන්න.❑



ප්‍රේමසිරි ගමගේ
සභාපති, ව්‍යාපාර සංවර්ධන කේන්ද්‍රය.

දැක්ම



"අපි එක්ව නැගී සිටිමු"

එච්. එන්. බී ග්‍රාමීන් සමාගම මේ ගෙවා දමන්නේ සිය ජීවිතයේ 15 වෙනි වසරය. ජීවිතය පිළිබඳ සැලකූ කල 15 වෙනි වසර යනු නව යොවුන් තාරුණ්‍යයේ බිහිදොර සමීපයේ නව්‍ය අත්දැකීම් සහ යෞවනයේ චමත්කාර අත්දැකීම් විඳින්නට සූදානම් වන සමයයි. බඩගාමින් දණ ගාමින් වැටි වැටී නැගිටිමින් ඇරඹූ ජීවිතය සේම ග්‍රාමීන් අපිද, පසුගිය වසර 15 පුරාම බොහෝ පීඩාවන් සහ උත්සාහයන් දරමින් නැගී සිටින්නට උත්සාහ දැරුවෙමු. විවිධ හැලහැප්පීම් බාධක කම්කටොළු අභිමුව නොසැලී හිඳිමින් අරමුණක් සොයා යෑමේ මහා පාරමිතාව පිරුවෙමු. අද උදාවී ඇත්තේ ඒ දුක්ඛ පාරමිතාවේ ප්‍රතිපල භුක්ති විඳින සමයයැයි අද අපි ලබන ජයග්‍රහන සහ සතුටු සිදුවීම් එක එකක් යළි යළිත් ආවර්ජනය කරන කල මට සිතේ. ග්‍රාමීන් තරුණයා එච් එන් බී ග්‍රාමීන් නමින් අභිසෙස් ලැබීම 2011 වසරේදී අප ආරම්භ කළ නවමු ගමන් මාර්ගයේ අතිශය සොඳුරු ජයග්‍රාහී සන්ධිස්ථානයකැයි මම සිතමි.

2011 වසරේ දී ප්‍රයිම් ග්‍රාමීන් නමින් අප මේ සමාගම අලුත් මාවතකට යොමු කරන විට සමාගම දරමින් තිබූ පාඩුව රු. බිලියන තුනයි දශම හතරක් විය. වසර හතරක් වැනි කාලය තුළ අප නියැලුනේ මේ පාඩුව ලාභයක් බවට පරිවර්තනය කරගැනීමේ දුෂ්කර වෑයමේය. ඒ, අප කාර්ය මණ්ඩලයටද එතෙක් නොවූ විරූ ප්‍රතිලාභයන් රැසක් භුක්තිවිඳීමේ අවස්ථාවන් ද එකින් එක අත්කර දෙන අතරතුරේම වීම විශේෂත්වයකි.

දිනෙන් දින වැඩිවන සේවා මධ්‍යස්ථාන ගණනද ශාඛාවන් වටා එක්රොක් වන සාමාජිකාවන් ප්‍රමාණයද අපගේ සේවාවෙහි ගුණාත්මක බව තහවුරු කරන සාධකම විය. ලබන ජයග්‍රහන සතුටින් දරාගනිමින් ඉන් උදම් නොවී අප පෙරට තැබූ පියවර සෙමෙන් වුව බොහෝ ස්ථාවර විය. මූල්‍ය ක්ෂෙත්‍රයේ නවමු වෙනස්කම් හඳුනාගනිමින් සහ ඒවා අප වෙතද කාන්දු කරගනිමින් නව තාක්ෂණික ක්‍රමවේද සමඟ නවතම මූල්‍ය සේවා රැසක තෘප්තිය අප පාරිභෝගිකයන් වෙත ලබා දෙමින් අප මේ සිවු වසර පැමිණියෙමු. ඒ සඳහා අප කාර්ය මණ්ඩලයෙන් ලද අනුපමේය සහය සහ නොසැලී අප සමඟ රැඳී සිටිමින් අප කෙරෙහි තැබූ විශ්වාසය පිළිබඳ මා තුළ ඇත්තේ කෘතඥ පූර්වක මතක සමුදායකි.

ඔබ නොවන්නට....., මේ සාමූහික ප්‍රයත්නය නොවන්නට, මෙතරම් කෙටි කලක් තුළ අද අප ලැබ සිටින ජයග්‍රහන කිසිවක් ලබා ගත නොහැකි බවට මම තරයේ විශ්වාස කරමි. ඒ වෙනුවෙන් නැවත නැවතත් ඔබට ස්තූතිවන්ත වන්නෙමි.

2015 වසර වන විට එතෙක් අප ලබා තිබූ පාඩුව රුපියල් බිලියන එකක ලාභයක් බවට පත් කර ගැනීමට අපට හැකි වීම ඒ ජයග්‍රහණයේ එක් සන්ධිස්ථානයකි. මෙතෙක් RAM Rating B ශ්‍රේණිගත කිරීම ලබා තිබූ අපට මේ වසරේදී මූල්‍ය ආයතන ප්‍රමාණගත කිරීමේ ඉහළම ආයතනයක් වන Fitch Rating ආයතනයේ Fitch Rating "A (lka) Stable" ප්‍රමාණගත කිරීම දිනා ගැනීමට හැකිවීම අපූර්වත්වයකි.

ආයතනය සේම ඔබගේ පෞද්ගලික ජීවිතයද පියවරින් පියවර ඉදිරියටම යායුතුය. ඔබ ඔබගේම නිවසක හිමිකරුවකු විය යුතුය. තමන්ගේම කියා වාහනයක හිමිකරුවකු විය යුතුය. ජීවිතය පිළිබඳව සුබ සිහින දකින්නට සේම ඒවා යථාර්ථයක් බවට පත්කර ගැනීමටද උත්සුක විය යුතුය. අප සේවකයන් නව නිවහන් ඉදි කරමින්, තම ජීවිතය ස්ථාවර තත්වයකට ගෙන ඒමට දරණ ප්‍රයත්නය දෙස මා බලා සිටිනුයේ උතුරා යන සොම්නසිනි. ඔබගේ ජීවිතය තුළ සේම අප ආයතනයද අද ලබන ජයග්‍රහනයක් වේ නම් ඔබගේ බිරිඳ සහ දූ දරුවෝද එහි අනිවාර්ය කොටස් කරුවන් වේ. ඒ රැයක් දහවලක් නොතකා ඔබ ආයතනය වෙනුවෙන් සේවයට කැපවෙද්දි ඒ කැපවීම උහුලාගෙන ඔබ පසුපස සිටිමින් ඔබට දිරිය සැපයූවේ ඔවුන් වන බැවිනි.ඔවුනටද මාගේ ස්තූතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

"අළුත් ඇසකින් ලෝකය දකිමින් අප එක්ව නැගී සිටිමු". මේ සෑම දිනකම මා ඔබ හමුවේ පැවසූ උදාන වාක්‍යයය. සිය පහළොස්වන විය ගෙවා දමන එච්.එන්.බී. ග්‍රාමීන් තාරුණ්‍යය අදට වඩා සොඳුරු අත්දැකීම් හා ජයග්‍රහන රැසක් නුදුරේදීම ලබන බව අද දිනයේ අප හමුවේ දිස්වෙන පෙර මඟ සලකුණු නිහඬ ඉඟි පළකරයි. ඒ සියල්ලේ සැබෑ උරුමක්කරුවන් අපය. අවැසි වන්නේ ඒ සඳහා වූ අපගේ කැපවීමය...... අධිෂ්ඨානය සහ උත්සහයය.....ඒ මඟ හමුවන එක් සන්ධිස්ථානයක් වූ ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය සමාගමක් බවට පත්වීමේ අපගේ ප්‍රයත්නය මල්ඵල දරන දිනය වැඩි ඈතක නොවේ. ඔබට ජය...

- චමින්ද ප්‍රභාත්
කළමනාකාර අධ්‍යක්ෂක

පහන් තරුව

තුති මල්

ගමින් ගම දොරින් දොර සිනාමල්   පිබිදුණා
සිතින් සිත යාවෙලා සමඟි දම්   ඇතිවුණා
අතින් අත රැඳවෙමින් මිතු දමින්   එක්වුණා
ඔබ නිසා අප සැවොම තුටු සිතින්   හිනැහුනා

නොදත් අය දැන හැඳින ලෙන්ගතුව   සතුටිනා
ගෙවූ හැම මොහොතකම සිත සතුට   දැල්වුණා
ලතා..ප්‍රේමා..සන්ධ්‍යා..සමන්තිත්   එක්වුණා
තනනු වස් දිනු ලොවක් ඔබට තව   ලංවුණා

නඟා පිය ජය ටැඹකරා යම් සිතේ ස්ථිර   අධිටනින්
නොහැක..බැහැ..යන සිතුවිලිද සෑණ දමමි අතුගා   ජීවයෙන්
හැකිය මට, මම කරමි යන ධන සිතුවිලිද හද   පුරවමින්
පෙරට යමි ග්‍රාමීන් කුමරියනි මම මගේ හද දිනු ඔබෙ   නමින්

දුන්නු පෙන්වා මගම යන්නට දරමි උත්සාහයම   සැමවිට
පළක් නැති දෙය නොවෙයි පළ ඇති දෙයම ළංකර ගනිමි   දිවියට
ලැබුණු සහයට සලකමින් කෘතගුණය දන්නා අයකු   විලසට
පුදමි තුති එච් එන් බි ග්‍රාමීන් මගේ හිත ගත් හිත   මිතුරියට

- ඩී.ඒ. චාලට් විජයසිරි
ඉසුරුපුර මධ්‍යස්ථානය
හොරණ ශාඛාව

කාලය

සෑම සියළු දෙනම නොමැති යැයි කී
මාද නිරතුරු පැවසූ ඒ වදනකි
නොමැත නොමැත මෙය කරුමෙකි
සැබවින්ම ඔබ කොහෙද මා නොදනිමි

සැලසුමක් නොමැති කම සැමදිනේ
අතපසු කරන වැඩ ගොඩගැසේ
වැඩ කන්ද එළවයි මා පසුපසේ
වරද ඔබෙ නොව මා අතේ

රන් වටී යැයි වියතුන් කියූ
කා දමයි නිකමුන් රිසිලෙසේ
වරද ඔබෙ නොව මා අතේ
කාලය ඔබ කොහෙද සැගවුනේ

- කේ.එල්. එරාජ්
ප්‍රාදේශීය කළමනාකරු

ඇය....

රුහිරු කිරිකර පොවා දූ පුතුන් රකින්නී
මිනිස් ගුණදම් වඩා ලොව අඳුර මකන්නී
ගිරි දුර්ග පසු කරන් පෙර මඟට ඇදෙන්නී
දැයට දිරි ගෙන එමින් විශ්වයම තනන්නී

නෙතු කඳුළු සඟවලා සිනා මතු කරන්නී
නේක දුක් ගැහැට මැද ජීවිතය විඳින්නී
ලොවේ හිරු සඳු ඇයයි ඝන අඳුර මකන්නී
නොනිමි සෙනෙහසින් ලොව සුවඳවත් කරන්නී

හිරුට පෙර අවදි වී දවසෙ වැඩ කරන්නී
සොඳුරු පද අමුණමින් ආදරය බෙදන්නී
දිරිය ඇති කතක් වී දැයට පණ පොවන්නී
සොයුරියකි... මවකි... ඇය ලොවම හැඩ කරන්නී....

- ඩී.එච්.ඩී.ජී. ජයමාලි
මුවගම මධ්‍යස්ථානය

HNB ග්‍රාමීන් ශාඛාවක වගතුග

රට තුළ නව ස්වයංරැකියා අවස්ථා වර්ධනය කොට ආර්ථික සංවර්ධනයට උරදීම අපේ අරමුණයි...

HNB ග්‍රාමීන් වැලිමඩ ශාඛාව

නුවර එළියෙන් බදුල්ල පාරට හැරුණු අපි හග්ගලට ළඟා වනවිට එතෙක් අඬන්නට අරඅඳිමින් බුම්මාගෙන සිටි කළු අහස එකවරම මහ හඬින් අඬන්නට වූයේ කඳු දෙකොපුල් තෙමා කඳුළු ධාරා විහිදුවමිනි. ''මම හග්ගලට එන්නම් අපිට එතකොට මඟින්ම හග්ගල ස්ටේට් වල ලීක්ස් වගාව කරන අපේ මෙම්බර්ගෙ වගා බිමත් බලාගෙනම එන්න පුළුවන්''...... අනෝරා වැස්ස එක සීරුවට නුවරඑළිය තෙමා ඇද හැලෙන හෙයින් වැලිමඩ ශාඛාවේ කළමනාකරු රෝහන අබේසේකර මහතා අප සමඟ කලින් දුරකථනයෙන් කතා කරගත් වැඩ පිළිවෙල වෙනස් කර ඇත්දෝයි අප තුළ ඇතිවූයේ කුකුසකි. එහෙත් ඒ කුකුසට සිත තුළ වැඩි වේලාවක් හොල්මන් කරන්නට ඉඩ ලැබුණේ නැත.'' .....මම ඇවිත් ඉන්නේ ඔයා හග්ගල කඩපේළිය පහු කරලා ටිකක් ඉස්සරහට එන්න......''ඇමතුම රෝහනගෙනි. ඔහු අපට දුන් පොරොන්දුවට බලපෑම් කරන්නට ඒ මහ වර්ෂාවට හැකිවී නැත. වැලිමඩ සිට බසයක නැගී හග්ගලට පැමිණි රෝහන අප රථයට ගොඩවූයේ කුඩයට ඔරොත්තු නොදුන් වැසි දිය දෑතින් පිස දමමිනි.

අව්ව වැස්ස කඳු හෙල් රෑ දහවල නොතකන ග්‍රාමීන් පිළිවෙත, සිය ගනුදෙනු කරුවාට සේවය සැපයීමේදී සැලකිල්ලට ගනු ලබන වැදගත්ම කරුණ වනුයේ ගනුදෙනුකරුවාගේ තෘප්තිය පමණකි. වැලිමඩ ශාඛාවේ වගවිත්ති ''මෙහෙවර'' ඔස්සේ ඔබට කියන්නට වැලිමඩට ගිය අපේ මුඛ්‍ය අරමුණද එච් එන් බී ග්‍රාමීන් වැලිමඩ ශාඛාව සිය ගනුදෙනුකරුවන්ට සලසාලනු ලබන සේවාවන් සහ බොහෝ දුෂ්කරතා විඳගනිමින් ග්‍රාමීන් අරමුණ වෙනුවෙන් වෙහෙසෙන වැලිමඩ ශාඛාවේ තරුණ කාර්ය මණ්ඩලයේ වෑයම ඇගයුමට ලක්කිරීමය.

දහස් සංඛ්‍යාත වූ දිරිය කාන්තාවන් පිරිසකගේ ජීවිත සමෘද්ධිමත් කරලීමේ කාර්යභාරයට උරදී සිටින එච් එන් බී ග්‍රාමීන් සමාගමේ වැලිමඩ ශාඛාවේ එම උදාරතර අරමුණු පිළිබඳව කියන්නට එහි ශාඛා කළමනාකරු වූ රෝහණ අබේසේකර මහතා සිය හඬ අවදි කළේ මෙසේය....

වැලිමඩ කියන්නෙ විවිධ ව්‍යාපාර විශාල සංඛ්‍යාවක් සංකේන්ද්‍රණය වුණු ප්‍රදේශයක් නෙවෙයි. මේ පළාත තුළ කෘෂිකාර්මික බෝග වගාවටත් සාම්ප්‍රදායික ව්‍යාපාර වලටත් හිමිවෙන්නේ විශේෂ තැනක් . විශේෂයෙන් එළවළු වගාව මල් වගාව කුඩා ස්වයංරැකියා ව්‍යාපාර මේ ප්‍රදේශයේ මිනිස්සුන්ගේ ජීවනෝපාය මාර්ග විදිහට ප්‍රචලිත වෙලා තියෙනවා. මේ අයගේ ජීවනෝපාය මාර්ග වැඩිදියුණු කරගෙන පවත්වාගෙන යාමට අවශ්‍ය මූල්‍යමය ශක්තිය ලබාදීමේ අරමුණ ඇතිව ග්‍රාමීන් ශාඛාවක් වැලිමඩ ස්ථාපිත කරන්නේ 2003 අවුරුද්දේ දෙසැම්බර් මාසයේදීයි. ඒ එච් එන් බී ග්‍රාමීන් ශාඛා ලැයිස්තුවේ 22 වන ශාඛාව විදිහට.

ඒ වගේමයි අපේ මධ්‍යස්ථාන පැතිරී ඇති ප්‍රදේශය ඉතා විශාලයි. සංඛ්‍යාත්මකව ගත්තොත් මධ්‍යස්ථාන 167 ක් වැලිමඩ ශාඛාව මඟින් මෙහෙයවනු ලබනවා. එම මධ්‍යස්ථාන හරහා අපේ සාමාජිකාවන්ට ව්‍යාපාර පවත්වාගෙන යාමට වගේම අළුතින් ව්‍යාපාර ආරම්භ කිරීමටත් අවශ්‍ය ණය පහසුකම් හා උපදෙස් ලබාදීමට අප සැදී පැහැදී සිටිනවා. අද වන විට අපේ සාමාජිකාවන් 4860 කට ණය පහසුකම් ලබා දී තියෙනවා.

අපේ මධ්‍යස්ථාන විසිරී ඇති ප්‍රදේශ ගත්තොත් වැලිමඩ ඉඳලා බණ්ඩාරවෙල ආසන්නය දක්වාත්, බදුල්ල පාරේ ඇටැම්පිටිය දක්වාත්, නුවරඑලිය පාරේ හග්ගල දක්වාත්, හපුතලේ පාරේ හල්දුම්මුල්ල දක්වාත්, ඌව පරණගම ප්‍රදේශයෙන් උඩු පුස්සැල්ලාව දක්වාත් අපේ මධ්‍යස්ථාන 167 ක් ස්ථාපිත කර තියෙනවා. මේ මධ්‍යස්ථාන හරහා එම ප්‍රදේශයන්හි සුළු ව්‍යාපාරවල නිරතව සිටින අප සමාගමේ සාමාජිකත්වය ලබාගන්නා සාමාජිකාවන්හට ණය මුදල් ලබා දීමට අපි කටයුතු කරනවා. ඒ අනුව මේ වෙනකොට රු. මිලියන 646.6 මුදලක් "දිරිය ණය" මුදල් ලෙස ලබාදීමට අපි කටයුතු කර තිබෙනවා. සාමාජිකාවන් ගේ එදිනෙදා අවශ්‍යතා සදහා ක්ෂණිකව ලබාදෙන "සහන ණය " ණය ක්‍රමය යටතේ රු මිලියන 71.5 ක් ද සාමාජිකාවන්ගේ සහ ඔවුන්ගේ පවුලේ උදවිය වෙනුවෙන් සලසා ඇති සාමාජිකාව සහ ණය ආරක්ෂණ අරමුදල යටතේ රුපියල් 335,000 මුදලක් මරණාධාර වශයෙන් ද ලබාදීමට පසුගිය කාලය තුළ අපි කටයුතු කළා.

ව්‍යාපාර කිරීම සඳහා අවශ්‍ය ණය මුදල් නිකුත් කිරීමට අමතරව අපි අපේ සාමාජිකාවන් සඳහා හොඳ සේවාවක් ලබාදීමට නිරතුරුව කටයුතු කරනවා. නිදසුනක් විදිහට ගත්තොත් අපේ සාමාජිකාවන් සඳහා විවිධ වැඩමුළු සහ ව්‍යාපාරික උපදේශන සේවා ක්‍රියාත්මක කරනවා. ඒ යටතේ පසුගිය කාලය තුළ වගාවන් හා සම්බන්ධ විවිධ ආයතන සමග එකතුවෙලා බිම්මල් වගාව සහ වෙනත් වගාවන්හිදි භාවිතා කරනු ලබන තාක්ෂණික උපක්‍රම ආදිය පිළිබඳව දැනුවත් කිරීමේ

5 පිටුවට...

එච් එන් බී ග්‍රාමීන් වැලිමඩ ශාඛාවේ නිළධාරී මඩුල්ල

එච් එන් බී ග්‍රාමීන් වැලිමඩ ශාඛාවේ නිළධාරී මඩුල්ල

ප්‍රාදේශිය කළමනාකරු
ගාමිණී ආරියසිංහ
ප්‍රාදේශිය ගණකාධිකාරි
රංගන මල්ලවආරච්චි
ශාඛා කළමනාකරු
රෝහන අබේසේකර
ශාඛා සහකාර කළමනාකරු
ප්‍රදීප් නිශාන්ත
සහකාර ගණකාධිකාරී
කුෂාන්ත චමින්ද
ක්ෂේත්‍ර කළමනාකරු
දුමින්ද තනූජ
දීපික නිලංග
ක්ෂේත්‍ර විධායක
උපාලි ජයවර්ධන
ජනක ප්‍රභාත්
තිලක් බන්දුල
සාගර සම්පත්
සමන් මනතුංග
රසික ප්‍රසන්ග
යූ.එම්.ආර්.චමින්ද
දිලිප් මධුශංක
චමත් උෂාන්
චාමර නුවන්
ගාමිණී ප්‍රසන්න
ඉංදික හේරත්
ගිණුම් සහායක
චන්දන ගුණතිලක
චමිල මධුශංඛ
සංජීව ජයලත්
වසන්ත රංජිත්
ඉතුරුම් විධායක
චමින්ද පුෂ්පකුමාර
අධිකරණ විධායක
ඉෂාර සංගීත්
විධායක නිළධාරී - සුළු හා මධ්‍ය පරිමාණ ණය
චාමර දිලුක්

සටහන - මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි
ඡායාරූප - ලක්ෂමන් කුමාරතුංග

ගාමිණී ආරියසිංහ
ප්‍රාදේශීය කළමනාකරු

රංගන මල්ලවආරච්චි
ප්‍රාදේශීය ගණකාධිකාරි

රෝහන අබේසේකර
ශාඛා කළමනාකරු

ප්‍රදීප් නිශාන්ත
ශාඛා සහකාර කළමනාකරු

කුෂාන්ත චමින්ද
සහකාර ගණකාධිකාරි

දුමින්ද තනූජ
ක්ෂේත්‍ර කළමනාකරු

දීපික නිලංග
ක්ෂේත්‍ර කළමනාකරු

... 4 පිටුවෙන්

වැඩමුළු පැවැත්වුවා. ඊට අමතරව සමාජ සත්කාරක සේවාවන් යටතේ ප්‍රදේශයේ දුෂ්කර පාසැලක් වූ උඩුහාවර මහා විද්‍යාලයට නාම පුවරුවක් HNB ග්‍රාමීන් ඉතුරුම් අංශයේ අනුග්‍රහයෙන් ඉදිකරදීමට අපට හැකියාව ලැබුණා. මූල්‍ය ක්ෂේත්‍රය තුළ දිනෙන් දින සිදුවන වෙනස්කම් සැලකිල්ලට ගනිමින් වඩාත් විශ්වසනීයවූත් කාර්යක්ෂම සේවාවක් අප ගනුදෙනුකරුවන් වෙත ලබාදීමට නිරතුරුවම අප කටයුතු කරන බව මේ මොහොතේ අවධාරණයෙන් සඳහන් කළ යුතුයි.

අද වෙනකොට හැටන් නැෂනල් බැංකුවට අනුබද්ධ මූල්‍ය ආයතනයක් විදිහට පෙරට වැඩි මූල්‍ය සේවාවන් රැසක් හඳුන්වාදීමට HNB ග්‍රාමීන් සමාගමට හැකිවෙලා තියෙනවා.සාමාන්‍ය ව්‍යාපාරකයින්ට වගේම අපගේ සාමාජිකාවන්ටත් වඩාත් පහසු සහ සාධාරණ මූල්‍ය සේවා සැපයීම තුළින් අපගේ රට තුළ ආර්ථික සමෘද්ධියක් ඇතිකරලීමේ ග්‍රාමීන් වෑයමට වාරුවක් වීමයි අපගේ ඒකායන බලාපොරොත්තුව.❑

එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්
අංක 33/1,හපුතලේ පාර
වැලිමඩ. දුරෑ 0572244800
ඊ මේල් welimada@hnbgrameen.lk

නිවෙස්හි බිත්ති මත අලංකරණය පිණිස එල්ලා තිබෙන දර්ශන අපට කිසිසේත් ආගන්තුක නොවන්නේ බොහෝ නිවෙස්හි ගෙතුළ අලංකරණය සඳහා එවන් දර්ශන රූ එකක් හෝ කිහිපයක් දැකිය හැකි නිසාවෙනි. ස්ක්‍රීන් ප්‍රින්ටින් නම් වූ තාක්ෂණ ක්‍රමවේදය භාවිතයෙන් නිමවෙන එවන් රූ සිත්තම් සිතට මෙන්ම නෙතටද මුසු කරනුයේ චමත්කාරයකි.

ආර් ඒ එල් පෙරේරා මහත්මියගේ නිවසට අප සේන්දු වන විට ඇය සිටියේ අළුතින්ම නිමවන ලද දර්ශන කිහිපයක අඩුපාඩු පුංචි පින්සලයකට ගත්තු සායම් පිරියමකින් ඔප මට්ටම් කරමින්. විසල් මේසයක් මත ඇඳ නිමවන ලද තුන්පත් රෑන,රත්නමාලි යන්ත්‍රය,දළදා පෙරහැර,රාත්‍රී දර්ශන ආදී එකී මෙකී නොකී දර්ශන රැසක එකතුව කියා පෑවේ කලාගාරයක විලාසයකි. මේ ව්‍යාපාරය ගොඩනගා ගැනීමට එච් එන් බී ග්‍රාමීන් "දිරිය" ණය මුදලින් ඇය ලැබුවේ කෙබදු සහනයක්ද.... අපි ඇගෙන් විමසීමු.

"මම මේ ව්‍යාපාරය පටන් අරන් දැන් අවුරුදු හයක් විතර වෙනවා. ටික කාලෙකින් මම මේ වැඩේට මගේ අයියවත් එකතු කර ගත්තා. කොළඹ හේලිස් එකෙන් තමයි මේ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ගෙන්වා ගන්නේ. ව්‍යාපාරය පටන් ගන්න

ව්‍යාපාරයක දියුණුව රැඳී තියෙන්නේ ලබා ගන්නා ණය මුදල ව්‍යාපාරය සඳහා සියයට සියයක්ම යොදවනවද කියන එක මතයි...

අවශ්‍ය මුදල මම ලබා ගත්තේ ග්‍රාමීන් සමාගමේ දිරිය ණය මුදලින්. මුලින් රු 20000 ණය මුදලක් තමයි මම ලබා ගත්තෙ.ව්‍යාපාරය දියුණු වෙද්දි ක්‍රමයෙන් ලබා ගත්තු ණය මුදල් ප්‍රමාණයත් වැඩි කර ගන්න පුළුවන් වුණා.ග්‍රාමීන් සමාගමේ ණය මුදල් ලබා ගැනීම පහසුයි. ඔවුන් ණය මුදල් ලබාදීමේදී බලන්නේ ලබා ගන්නා ණය මුදල අපි ව්‍යාපාරය සඳහා සියයට සියයක්ම යොදවනවද කියන එකයි අප තුළ ව්‍යාපාරය දියුණු කර ගැනීමට ඇති උනන්දුවයි පිළිබඳව තමයි.අපේ සීනරීස් වලට වෙළෙඳ පොළේ හොඳ ඉල්ලුමක් තියෙනවා. ඒ නිසා ව්‍යාපාරයේ හෙට දවස ගැන අපිට බයක් නෑ.

ආර් ඒ එල් පෙරේරා
වැරැල්ල වත්ත, කැප්පෙටිපොළ.

ඉතිරි කිරීමෙන් වැඩි පොලියක් ගැනීමටත් ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කර ගැනීමටත් අපිට පුළුවන් වෙලා තියෙනවා...

"මේ පළාතෙ හුඟක් වගාවන්ට සුදුසු දේශගුණික රටාවක් තමයි දකින්න තියෙන්නෙ. ඒ නිසාම වගාවන්ට වැඩි නැඹුරුතාවක් සහිත ව්‍යාපාර වැඩිපුර දකින්න පුළුවන්. අපි මල් වගාව ව්‍යාපාරයක් විදිහට පටන් අරන් අවුරුදු දොළහක් විතර වෙනවා...."

මල් වගාව සිය ව්‍යාපාරය විදිහට කරගෙන යනු ලබන සමරසිංහ මහත්මිය අප සමග කතාබහ ඇරඹුවේ එලෙසින්. මල් වගාව ව්‍යාපාරයක් ලෙස කරගෙන යාමේදී ඔවුන් මුහුණ දුන් ප්‍රධාන ගැටළුවක් වුයේ වගාව සඳහා අවශ්‍ය පොලිතින් ගෘහ ඉදිකිරීම (Tunnel) සඳහා අවශ්‍ය මුදල් සොයාගැනීම.ඒ සඳහා 2013 වසරේදී ඇය ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වූ අතර මුල්ම ණය මුදල වශයෙන් ලබාගත්තේ රු 35000 ණය මුදලක්.

ග්‍රාමීන් සමාගමට බැඳිලා ලබාගත්තු ණය මුදල් නිසා මට සල්ලි අවශ්‍යතා වලට බොහොම පහසුවෙන් මුහුණ දෙන්න පුළුවන් වුණා. මොකද මට මුදල් අවශ්‍ය වෙන අවස්ථා හඳුනාගෙන මගේ ණය මුදල් සැලසුමක් ඇතිව ලබාගන්න මට පුළුවන් වුණා.අද වෙද්දි ලක්ෂ දෙකහමාරේ ණය මුදල දක්වා මම ගිහින් තියෙනවා. ඒ මුදල් වැඩිපුරම යෙදෙව්වේ පොලිතින් ගෘහ ඉදිකිරීමටත් අළුත් මල්වර්ග බෝකර ගැනීමටත් තමයි. අපිට වෙළෙඳපොළ සොයා ගැනීම දුෂ්කර නෑ. මොකද වෙළෙන්දො අපි ළඟටම ඇවිත් පැල ගෙනියන නිසා. උපයන මුදල් හොඳ පොලියක් සහිත මියුලැසි කාන්තා ගිණුමේ ඉතිරි කිරීමෙන් වැඩි පොලියක් ගැනීමටත් ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කර ගැනීමටත් අපිට පුළුවන් වෙලා තියෙනවා.

ඩබ්.එම්.එම්. සමරසිංහ
සඳලි ගාර්ඩ්න්ස්, විරහාවත්ත

අපට තෘප්තිමත් විය හැකි මූල්‍ය සේවාවක් එච් එන් බී ග්‍රාමීන් එකෙන් ලැබෙනවා

වැලිමඩ කොහොමත් ප්‍රසිද්ධ එළවළු වලට. එයිනුත් අර්තාපල්, ලීක්ස්,කැරට්, ගෝවා වගේ එළවළු වර්ග ප්‍රධානයි. ආනන්ද ලක්ෂ්මිගේ ලීක්ස් වගාව පිහිටලා තිබුනේ බදුල්ල හග්ගල මාර්ගයේ හග්ගලට කිට්ටුව අතුරු මාර්ගයකින් හැරිලා ගියාම. හග්ගලට දෙපත් කපාගෙන අනෝරාවට වැස්ස වැටෙද්දි අපි ලක්ෂ්මිගේ ලීක්ස් වගාව බලන්න ගියා. කඳු බෑවුමකට වෙන්නට පිහිටලා තිබුණු වගා බිම නෙතට එක්කළේ සුන්දර දර්ශනයක්.

අපේ අම්මා තාත්තාගෙ ඉඳන් වගා කටයුතු වල තමයි නියැලිලා හිටියේ. අළුතින් බිම් හදලා වගා කටයුතු ආරම්භ කරන කාලෙට තමයි හුඟක්ම මුදල් අවශ්‍ය වෙන්නෙ. මම මුලින්ම එච් එන් බී ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වුනෙත් වගාවට අවශ්‍ය මුදල් ණය මුදලක් විදිහට ලබා ගැනීමේදී අනිත් මූල්‍ය සමාගම්වල නැති පහසුවක් ග්‍රාමීන් සමාගමෙන් ලැබෙන නිසයි. පහුගිය අවුරුදු තුනක විතර කාලේ ඉඳන්ම මම විවිධ ප්‍රමාණයන්ගෙන් ණය මුදල් අරන් තියෙනවා. මේ කාලය පුරාම මම වෙනත් මූල්‍ය සමාගම් වෙත නොගියේ අපට තෘප්තිමත් විය හැකි මූල්‍ය සේවාවක් එච් එන් බී ග්‍රාමීන් එකෙන් ලැබෙන නිසයි.

කේ. ආනන්ද ලක්ෂ්මි
හග්ගල ස්ටේට්, බොරගස්

HNB ග්‍රාමීන් ෆිනෑන්ස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිළධාරි චමින්ද ප්‍රභාත් මහතා සමග කළ සාකච්ඡාවක් ඇසුරිනි.

ණය අයැදුම්පතක කාර්යභාරය හඳුනාගනිමු

ඕනෑම මූල්‍ය ආයතනයක් ආදායම් උපයා ගන්නා එක් ක්‍රමෝපායක් වනුයේ ණය මුදල් නිකුත් කිරීමයි. මනා සුපරීක්ෂණයක් යටතේ සිදුකළයුතු ණය නිකුත් කිරීමේ කාර්යයයේදී අනෙකුත් මූල්‍ය සමාගම් හා තරඟ කාරීත්වයකට මුහුණ දීමේ අභියෝගයටද මූල්‍ය සමාගම් විසින් මුහුණ දෙනු ලබයි. තරගකාරීත්වයට මුහුණ දෙමින් මනා සුපරීක්ෂණයකින් යුතුව ණය ලබාදීම යනු අභියෝගාත්මක කාර්යයකි. දැළි පිහියකින් කිරි කනවා වැනි මෙම ක්‍රියාවලියේදී ගනුදෙනුකරුවන් වර්ධනය කර ගැනීමේ හා ඔවුන් නිසි ලෙස හඳුනා ගැනීමේ වගකීමක් ණය බාර නිළධාරීන්ට පැවරේ.

ගනුදෙනු කරුවන් වර්ධනය කර ගැනීම සහ මූල්‍ය සමාගම් විසින් අනුගමනය කරනු ලබන ප්‍රවර්ධනාත්මක ක්‍රමවේදයන් පිළිබඳව පසුගිය මෙහෙවර කළාපයෙන් අපි සාකච්ඡා කළෙමු. ප්‍රවර්ධනාත්මක වැඩසටහන් ඔස්සේ සහ වෙනත් මාර්ගයන් ඔස්සේ ණය මුදලක් ලබාගැනීම සඳහා මූල්‍ය සමාගමක් වෙත එන ගනුදෙනුකරුවාගේ තොරතුරු දැනගනු ලබන්නේ ඔහු විසින් පුරවනු ලබන ණය අයැදුම් පත මගිනි. එම ණය අයැදුම්පත මගින් ගනුදෙනුකරුවා පිළිබඳව සහ ඔහුගේ ණය අවශ්‍යතාව පිළිබඳව යම් පමණක හැදෑරීමක් සිදු කිරීමේ හැකියාව ණය බාර නිළධාරියාට ලැබේ.

ණය අයැදුම්පතක් සකස් විය යුත්තේ කෙසේද?

ණය අයැදුම්පත කාහට වුව කියවා පැහැදිලිව තේරුම් ගත හැකි අයුරින් සරළ ලෙස සකස් විය යුත්තකි. ලබා ගන්නා දත්ත, ණය මුදලට සෘජුවම වැදගත් වන කරුණු විය යුතු අතර ඒවා කෙටියෙන් ලබා ගැනීම ඉල්ලුම්කරුට සලසාලනු ලබන පහසුවකි. ඇතැම් ණය ඉල්ලුම් කරුවන්ගේ සාක්ෂරතාව ඉතා පහල මට්ටමක පැවතිය හැකි අතර ඇතැම් විට ඉල්ලුම් පත්‍රය ණය බාර නිළධාරීයාටම සම්පූර්ණ කර දීමට සිදුවන අවස්ථා කොතෙකුත් දක්නට ලැබේ.

ණය ඉල්ලුම් පත්‍රයෙහි ණය මුදල ලබා ගැනීමේදී සලසා ඇති පහසුකම්, ණය ඉල්ලුම්කරු සපුරාලිය යුතු සුදුසුකම්, ආදිය පිළිබඳව පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.

අයැදුම් පත්‍රයේ අඩංගු වන තොරතුරු ඇසුරින් ණය ඉල්ලුම්කරු හා සම්බන්ධ වන වැදගත් තොරතුරු එනම් අයැදුම්කරුගේ පදිංචිය, පවුලේ තොරතුරු, සෞඛ්‍ය තත්වය, අධ්‍යාපනික මට්ටම, වෘත්තීමය සුදුසුකම්, ව්‍යාපාරය හා සම්බන්ධ තොරතුරු හා එහි ස්වාභාවය යනාදිය හෙලිකර ගතහැකි විය යුතුය.

අයැදුම්කරුගේ ආදායම් පිළිබඳව තොරතුරු හෙළි කරගත හැකි මාර්ගයක් ලෙස ද ණය අයැදුම්පත සිදුකරනුයේ සුවිශේෂී කාර්යභාරයකි. ඊට අනුව අයැදුම්කරුගේ ආදායම් මාර්ග පිළිබඳව හෙලිකර ගත හැකි තොරතුරු සුවිශේෂී වේ. අයැදුම්කරු ආදායම් ලබන්නේ දෛනිකවද, මාසිකවද, එසේත් නැතිනම් නිශ්චිත වූ කාල පරිච්ඡේදයක් තුළද යනාදියත්, ඔහුගේ වත්කම් ජංගම හෝ ස්ථාවර ඒවද යන වගත්, අයැදුම්පත්‍රය තුළින් හෙළිකර ගත හැකි විය යුතුය. ව්‍යාපාරයේ රක්ෂණාවරණයන් පිළිබඳව සේම අයැදුම්කරුගේ ව්‍යාපාරික සැලැස්මවල් සහ පෞද්ගලික ජීවිතයේ ඇති සැලැස්මවල් පිළිබඳවද ණයභාර නිළධාරියා තුළ යම් දැනුමක් වේනම් ණය නැවත අයකර ගැනීමේදී මතුවිය හැකි අර්බුදකාරී තත්වයන් අවම මට්ටමක පවත්වාගත හැකිය.

ඇසිඩ් ටෙස්ට් (Acid Test)

ණය අයැදුම්කරුගේ ආදායම් තත්වයන් හා ඔහුගේ වියදම් තත්වයන් අතර ගැලපීම සොයා බැලීමට ඊට අනුව අයැදුම්කරුට ණය මුදල් ලබා දීම කුමන සීමාවන්ට යටත්ව කළයුත්තක් ද යන්න පිළිබඳව අවබෝධයක් මූල්‍ය ආයතනයට ලබා ගත හැකි වන පරිද්දෙන් සිදුකරනු ලබන විමර්ශනය ඇසිඩ් ටෙස්ට් නම් වේ.

මෙහි දී නිවසේ වියදම් තත්වය සහ ව්‍යාපාරයේ ආදායම් තත්වය ගණනය කර එම මාසික ආදායමත් වියදමත් අතර වූ වෙනසින් සියයට පනහක් ණය වාරිකය ලෙස අය වන ආකාරයට ණය මුදලක් ලබා දීමට මූල්‍ය ආයතනයට හැකියාව ඇත. නිදසුනක් ලෙස ගතහොත් ණය ඉල්ලුම්කරුගේ ව්‍යාපාරයේ මාසික ආදායම රු.ලක්ෂයක් නම් නිවසේ මාසික වියදම රු. 50,000 නම් මේ ආදායමත් වියදමත් අතර වෙනස වූ රු. 50,000න් 50% එනම් ණය වාරිකය රු. 25,000 වන පරිදි ණය මුදලක් ලබා දීමට මූල්‍ය ආයතනයකට හැකියාව ඇත. මේ අනුව ණය ඉල්ලුම්කරුගේ ණය ඉල්ලුම් පත්‍රය සහ ඇසිඩ් ටෙස්ට් ගණනය කිරීම අනුව දෙනු ලබන ණය මුදලේ ප්‍රමාණය මූල්‍ය ආයතනය මඟින් තීරණය කරනු ලැබේ❑

උපාලි... හොරු අල්ලන්න පැය හතරක මෙහෙයුමක් දියත් කරයි....

උපාලි ජයසිංහ
– කළමනාකරු, කුරුණෑගල ශාඛාව

පුංචි කාලේ මම

සම්පූර්න නම ෘ- දිසානායක මුදියන්සේලාගේ අජිත් උපාලි ජයසිංහ

උපන් දිනය (කැමති නම්) ෘ- 1982.04.25

පාසැල් කාලයේ ඔබේ ප්‍රියතම පාසැල ෘ- මම ඉස්සෙල්ලම ගියේ ගල්කොල කණිෂ්ඨ විද්‍යාලයට. පහේ ශිෂ්‍යත්වය පාස්වුණාට පස්සේ මට පින්නවල ජාතික පාසලට යන්න අවස්ථාව ලැබුණා. උසස්පෙළ පන්තියට යනකම් මම ගියේ ඒ පාසැලට. ඒත් මම අදත් කැමැති මම පහේ පන්තියට වෙනකම් ගිය ගල්කොළ කණිෂ්ඨ විද්‍යාලයට. ඒක පුංචි දුප්පත් ඉස්කෝලයක් මුළු ඉස්කෝලෙටම හිටියේ ළමයි 70 අඩුවෙන්. ගුරුවරුත් හත්දෙනෙක් විතර. අපේ ගෙදර ඉඳලා ඉස්කෝලෙට කි.මී. දෙකක් විතර දුර තිබුණා. ඒ දුර අපි ආවේ ගියේ පයින්. ඒ පාරෙ බස් ගියේ නෑ.දුර ඉඳලා බස්වල එන ගුරුවරුත් ඉස්කෝලෙට හැරෙන හන්දියෙන් බස් එකෙන් බැහැලා අපිත් එක්ක ඉස්කෝලෙට පයින් ගියා. ළමයි සහ ගුරුවරු අතර සමීප සම්බන්ධයක් වගේම සුන්දර ළමා කාලයක් ඒ කාලය අතර තුර මම අත්වින්දා.

විෂය ෘ- සිංහල

ක්‍රීඩාව ෘ- පාපන්දු, අවුරුදු ගණනාවක්ම මම පාසැලේ පාපන්දු කණ්ඩායමේ උප නායකයා විදිහට කටයුතු කළා. 1999 අවුරුද්දේදි මයිලෝ සමස්ත ලංකා පාපන්දු තරගාවලියෙන් අපේ පාසැලට අනුශූරතාවය හිමි කරදෙන්නට අපිට පුළුවන් වුණා.

පාසැල් කාලයේදී ලොකු වුණාම වෙන්න හිතන් හිටියේ ෘ- අපේ තාත්තා කළේ පොල් වෙළෙඳාම. මට දැනුම් තේරුම් එන කාලේ වෙනකොට අපි හුගාක් ආර්ථික ප්‍රශ්න වලට මුහුණ දෙමින් හිටියා. අම්මයි තාත්තයි අයියයි මමයි මල්ලියි හිටිය අපේ පවුල ඒ අග හිඟකම් වලින් හුඟක් බැට කෑවා. කොටින්ම ඉස්කෝලෙට දාගෙන යන්න සෙරෙප්පු දෙකක් නැති කාලවල් තිබුණා. ඒ කාලෙ මගේ එකම ඉලක්කය වුණේ කවද හරි ලොකු රස්සාවක් කරලා අපේ පවුල මේ වැටී ඉන්න තත්වයෙන් ගොඩ ගන්නවා කියන දේ මිසක් අහවල් රස්සාව කරනවා කියලා නෙමෙයි.ඒත් සාමාන්‍යපෙළ විභාගෙ හොඳට පාස් වුණාම මම උසස්පෙළට ජීව විද්‍යාව තෝරාගත්තේ දොස්තර කෙනෙක් වෙන්න හිතාගෙන .

මුල්ම රැකියාව එක සහ වඩාත්ම ආශාවෙන් කළ රැකියාව ෘ- මම මුලින්ම රස්සාව කළේ සෙලින්කෝ ඉන්ෂුවරන්ස් එකේ අළෙවි නියෝජිතයෙක් විදිහට. 2002- 2004 කාලේ. ඉන් පස්සේ මගේ ළඟම යාළුවෙක් වුණු මාධනගේ මගපෙන්වීම උඩ මම ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වුණා. ග්‍රාමීන් සමාගමේ රැකියාවට මම වඩාත් කැමැතියි. මේ රැකියාව තුළින් මිනිස්සුන්ට සේවයක් කිරීමට ලැබීම කියන කාරණයට අමතරව තව හේතුවක් තියෙනවා මේ රැකියාවට කැමැතිවෙන්න ඒ ග්‍රාමීන් එකේ අපි අතර තියෙන සහෝදරත්වය සහ බැඳීම. එකිනෙකාට උදව් කරගන්න,එකිනෙකාගේ දුකේදි ළඟ ඉන්න ගතියක් මුල් කාලේ ඉඳලා අපි අතර තිබුණා. ඒත් මෑතක ඉඳන් ඒ ලෙන්ගතුකම අපෙන් ඈත් වෙනවද කියලා සමහර සිද්ධි දිහා බැලුවහම හිතෙනවා.

සටහන
මංජුල හෙට්ටිආරච්චි

ජීවිතේ අමතක නොවන සිද්ධිය ෘ- එක පාරක් හෙඩ් ඔෆිස් එකේ අපි නුවරඑළිය ශාඛාවට විසිට් එකක් ගිහින් හිටිය වෙලාවක සෙන්ටර්ස් ගිය අපේ දෙන්නෙක්ගේ සල්ලි මංකොල්ල කාලා කියලා පණිවිඩයක් ආවා. වෙලාව හවස හතරට විතර ඇති. ඒක දැනගත්තු ගමන්ම අපි හත්අට දෙනෙක් බයික් වල ගිහින් පැය ගාණක් මුළු පළාතම පීරලා මංකොල්ලෙට ආපු බයික් එක හොයාගෙන හොරුන්වත් අල්ල ගත්තා.එදා අපේ ජීවිතවලට ඇතිවිය හැකිව තිබූ අනතුරුදායක බව ගැනවත් නොහිතා අපි කරපු ඒ දේ බරපතලකම ගැන අපිට තේරුණේ පස්සෙයි.

ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දිනය සහ දුකට පත්වුණු දිනයඃ- වඩාත්ම සතුටට පත්වුණේ 2015 ජනවාරි 05 මගේ පුතා සසේන් ලක්බන දිසානායක ඉපදුන දවසේ.දුකට පත් වුණු දවස් අතරින් 2005 දි මගේ තාත්තා අංශභාගෙ රෝගයට ගොදුරු වුණු දවස මුලින්ම මගේ මතකයට එනවා.

අතීතයට යාමට වරමක් ලැබුනොත් ඔබ තෝරාගන්නා ජීවිතේ හොඳම කාලය සහ ඊට හේතුව ෘ- උසස්පෙළ කරපු කාලය.ඒ කාලේ මම හුඟක්ම ක්‍රීඩාවට නැඹුරුවෙලයි හිටියේ.

11 පිටුවට

ග්‍රාමීන් ශක්තියයි ඇගේ දිරියයි

ජීවිතය ඇතමුන්ට සියලු සැප සම්පත් භවභෝග ළඟටම ගෙනවුත් දෙන්නේය. එහෙත් බොහෝ දෙනෙකුන්ගේ ජීවිත දෙස බැලූ විට පෙනී යන්නේ ඒවා තමන් විසින්ම සොයා හඹා ගොස් හරිහම්බ කරගත් බවය. එකම ජීවිතය දෙපිරිසකට මෙසේ සැලකුවද එය දෛවය හෝ ලබා උපන් හැටියැයි කියා සිත හදා ගන්නට අප පුරුදුව සිටිමු.

ජීවිතය තුළ වූ අනේක විද දුක්ඛ දෝමනස්සයන් ඉවසා දරා ගනිමින් අතිශය කැපකිරීම් හා අධිෂ්ඨානයකින් යුතුව දිවි මඟ සරුකර ගත්තෝ සියළු සැප සම්පත් උපතින්ම ලැබූවන්ට වඩා ජීවිතය විඳින්නේ යැයි ඔවුන්ගේ ජීවිත අත්දැකීම් අසා සිටින බොහෝ වාරයන් හී මට දැනී ඇත. අතීතය තුළ වූ දුක්කම්කටොලු හා පරාජිත අත්දැකීම් වර්තමානය තුළ ඔවුන් වඩාත්ම තලු මර මරා රස විඳින ජීවිතයේ රසමුසුම තැන්ය. සැබැවින්ම අත්දැකීම් වලින් පිරිපුන් ජීවිතය ඔවුනට ලඟා කර දී ඇති තෘප්තිය අන් සියල්ල අභිබවනය කරන්නේය.

"අයිනුන් ජෙලීලා සරින්ඩීන්" ඇය උපතින්ම මුස්ලිම් කාන්තාවකි.වැලිමඩට නුදුරු ගම්මානයක මීට දශක හයකට පමණ ඉහතදී ඇය උපත ලබන විට මේ ගම්මානය අදටද වඩා බොහෝ දුෂ්කරතාවයන්ගෙන් පිරි ගම්මානයකි. සහෝදර සහෝදරියන් සිවු දෙනෙකුගෙන් යුත් පවුලක තෙවෙනියා ලෙස උපත ලද ජෙලීලා සිය දෙමාපියන් ජීවිත සටන ජය ගන්නට දරණ උත්සාහය අත්වින්දේ කුඩා වියේ සිටමය. තාත්තාගේ කුඩා එළවළු කඩය සහ තේ කඩය විසින් උපයා දුන් ආදායමේ අඩුපාඩුව පිරිමැහුනේ අම්මා විසින් මැහුම් ගෙතුම් කිරීමෙන් උපයාගත් ආදායමෙනි.

''....වන්නිය කුඹුර මහා විද්‍යාලයෙන් උසස් පෙළට වෙන තුරු මම ඉගෙන ගත්තා. ඇත්තටම අපේ අම්මා තාත්තා අපට ඉහලටම උගන්නන්න හුගක් වෙහෙසුනා. අපි කුප්පි ලාම්පු එළියෙන් පාඩම් කරපු හැටි මට තාම මතකයි. එතකොට අපේ ගමට ලයිට් තිබුනේ නෑ. ඉගෙනගෙන ඉවර වෙලා මම රස්සාවක් හෙවුවා. ඒත් ලැබුනේ නෑ. මැහුම් ගෙතුම්වලට පුංචිකාලේ ඉදලම මගේ අත හුරු වෙලයි තිබුණේ. දන්න දෙයින් ජීවිතේ ඉස්සරහට ගෙනියනවා කියලා මම හිතා ගත්තා. ඒ ගමන ගෙදරම ඉදන් මහන්න පටන් ගත්තා. අම්මත් උදව් කළා. අහල පහළ අයගේ ඇඳුම් තමයි මුලින්ම මැහුවේ. එතකොට මේ ලඟ අහලකවත් ඇදුම් මහන තැනක් තිබුනේ නෑ. ඔය අතරේ මම විවාහ වුණා. මහත්තයා සේල්ස් රෙප් කෙනෙක් විදිහට වැඩ කළේ. බැන්දට පස්සේ මම එතෙක් කුලියට ඇදුම් මහ මහා හිටිය වැඩේ අත්හැරලා මහරගමින් රෙදි ගෙනැත් ඇදුම් මහන්න පටන් ගත්තා. ඒ අතරේ මනාලියන් ඇන්දවීමත් කළා. අද මේ අඩියක් අඩියක් ගානේ මැහුම් සාප්පු තිබුණාට මනාලියන් ඇන්ද වීම් කළාට ඒ කාලේ මේ රස්සාවට ඒ තරම් තැනක් තිබුනේ නෑ. ඒ නිසා ඒවා කරන අයත් හරි අඩුයි. මේ පළාතෙන්ම මම විතරයි කළේ. ගෙදර වැඩපළත් කරගෙන දරුවොත් හදාගෙන මම සාමාන්‍ය විදියට ව්‍යාපාරය කරගෙන ගියත් ඒකේ ලොකු දියුණුවක් තිබුනේ නෑ.

2005 අවුරුද්දේ මට යාළුවෙක්ගෙන් ආරංචියක් ලැබුණා. පුංචි පුංචි බිස්නස් කරන කාන්තාවන්ට ණය දෙන සමාගමක් ග්‍රාමීන් කියලා තියෙනවා කියලා. ඒ ගමන මමත් ඒ ගැන හොයලා බැලුවා. එතකොට අපේ ගමට ග්‍රාමීන් මධ්‍යස්ථානයක් තිබුනේ නෑ. මම වැලිමඩ ශාඛාවේ සර්ලා හම්බවෙලා ගුරුතලාවෙත් මධ්‍යස්ථානයක් පටන් ගන්න යැයි ඉල්ලීමක් කළා. ගුරුතලාව මධ්‍යස්ථානය පටන් ගන්න අපි ලොකු වෙහෙසක් ගත්තා.

මේ අතරේ අපේ පල්ලියෙන් මට ප්‍රශ්නයක් ආවා. මුදල් ණයට ගැනීම, පොලී ගෙවීම වගේ දේවල් අපිට ආගමෙන් තහනම් වෙලා තිබුන නිසා. ඒ වෙද්දි මම ග්‍රාමීන් සමාජිකාවක් වෙලා රුපියල් 25000/-ක ණය මුදලකුත් අරගෙන. මම පල්ලියට ගිහින් කිවුවා අපි සල්ලි ණයට ගන්නේ නෑ පල්ලියෙන් අපිට උදව් කරනවානම් කියලා.

මම ග්‍රාමීන් සමාගමත් එක්ක දිගටම හිටියා. ණය ගත්තා ඒවා ගෙව්වා. ආපහු ඊලඟ ණය මුදලට ගියා. ගෙයි ඇතුලේ කරගෙන ගිය ව්‍යාපාරය ''රෙඩ් රෝස්'' කියන නමින් මැහුම් සාප්පුවක් විදිහට වර්ධනය කළා. දැන් අපිට මෙතැන ඉඩකඩ මදි. ඒ නිසාම මම අළුතින් මගේ සාප්පුවටම කිට්ටුව අළුත් ගොඩනැගිල්ලක් ඉදිකරගෙන යනවා. ළඟදිම එතැනට මැහුම් සාප්පුව ගෙනියන්නයි බලාපොරොත්තුව. අද වෙද්දි හුගක් මැහුම් සාප්පු තියෙන නිසා අපි ලඟට එන පිරිස අඩුයි. ඒ නිසා අපි දන්න හදුනන අයගෙ මාර්ගයෙන් ආයතන වලට ගිහින් ඇදුම් විකුණනවා. මෙහේ වතු වල ඉන්න අය ලඟට ගිහින් ඒ අයට ණයට ඇදුම් දෙනවා, සිට්ටු ක්‍රමයටත් දෙනවා. ව්‍යාපාරයක් කරද්දි කාලෙන් කාලෙට එන අභියෝග භාරගන්න ඕන. ලාභ වෙනවා පාඩු වෙනවා ඔහොම තමයි ජීවිතේ. මේ හැමදේම එක්ක එච්. එන්. බී. ග්‍රාමීන් සමාගම අපිට යෝධ හයියක් වෙලා අවුරුදු ගානක ඉඳන් අපිත් එක්ක ඉන්නවා. අපේ බැරි අමාරුකම් වලට පිහිට වෙනවා. අපි දියුණු වෙද්දි සතුටු වෙනවා. නෑදැයෙක් හිතවතෙක් වගේ ග්‍රාමීන් සමාගම දැන් අපේ පීවිත වලට බද්ධ වෙලා ඉවරයි.

නෑදෑයෙක් හිතවතෙක් වගේ ග්‍රාමීන් සමාගම දැන් අපේ ජීවිත වලට බද්ධ වෙලා ඉවරයි.

ජෙලීලා පවසනුයේ දෑස් පුරා ඉහිරුණු සතුටු කදුලින් යුතුවය. ජීවිතය ඇයට බොහෝ සැපසම්පත් ලබා දී නැත. ඇත්තේ ඇය විසින් ආත්ම ශක්තියෙන් හා ධෛර්යයෙන් යුතුව උපයා සපයා ගත් දේය. එහෙත් ඒ සියල්ලට වැඩි අත්දැකීම් ප්‍රමාණයක් හා නැවත නැවත සිහිපත්කොට සතුටු විය හැකි තෘප්තිමත් අතීතයක් හා වර්තමානයක් ජීවිතය විසින් ඇයට තිළිණ කොට දී ඇත්තේය❑

සටහන
මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි
ඡායා - ලක්ෂමන් කුමාරතුංග

"මම හිතුවටත් වඩා කෙටි කාලයකින්

අභිලාෂ

ණය මුදල ලබාගන්න මට පුළුවන් වුණා..."

බයිට් නිෂ්පාදනය බොහෝ ව්‍යාපාරිකයින් ප්‍රමාණයක් නිරතව සිටින ව්‍යාපාරයක් ලෙස හැඳින්වුවහොත් එහි වරදක් නැහැ. දරුවන් අතර සේම වැඩිහිටියන් අතරද බයිට් වර්ග ජනප්‍රිය කෑමක් වීම නිසාම එහි වෙළෙඳපොළ ඉල්ලුම පිළිබඳව ගැටළුවක් පැන නගින්නේ නෑ.''හදන තරමක් විකුණාගන්න පුළුවන්.....'' මේ බයිට් නිශ්පාදනයේ නිරත ව්‍යාපාරිකයින් පවසන එක් පොදු අදහසක්. කරදිමුල්ල ගුරුතලාවේ පදිංචි කිච්ල් මොහොමඩ් ෆාරුක් ද බයිට් නිශ්පාදනය සාර්ථකව කරගෙන යන ව්‍යාපාරිකයෙක්.

''අවුරුදු විසිහතරක් වෙනවා මම මේ ව්‍යාපාරය පටන් අරන්.මික්ස්චර්,කඩල,පොරි,සීනි මුරුක්කු, වගේ බයිට් වර්ග ගණනාවක් අපි දැනට නිශ්පාදනය කරනවා, සිෆානා නිශ්පාදන නමින් ව්‍යාපාරය සාර්ථක මට්ටමකින් පවත්වාගෙන ගියත් මගේ බිරිඳ අසනීප වෙලා මට විශාල මුදලක් වැය කරන්න සිද්ධ වුණා එයාව සනීප කර ගන්න.ඒ කාලය තුළ මගේ ව්‍යාපාරයත් සෑහෙන මටට්මක පසුබෑමකට ලක්වුණා. මගේ බිරිඳ ග්‍රාමීන් සාමාජිකාවක් වුණත් ග්‍රාමීන් ණය ක්‍රමය අනුව එකපාර විශාල ණය මුදලක් ගන්න බෑ මොකද ව්‍යාපාරය වැටිලා තිබුණු තත්වයෙන් ගොඩගන්න තරමක ලොකු ණය මුදලක් මට අවශ්‍ය වුණා. ඒ ගමන තමයි මම කල්පනා කළේ එච් එන් බී ග්‍රාමීන් සමාගමෙන් ''අභිලාෂ'' ණය මුදලක් ලබා ගන්න. මම හිතුවටත් වඩා කෙටි කාලයකින් ඒ ණය මුදල ලබාගන්න පුළුවන් වීම නිසා මගේ ව්‍යාපාරය යළිත් පෙර තිබූ මට්ටමටත් වඩා වැඩි සාර්ථක මට්ටමකට ගේන්න මට පුළුවන් වුණා.අපේ නිශ්පාදන ප්‍රවාහනය කරන්න පුංචි ලොරියකුයි බයික් එකකුයි මට තියෙනවා. ගෙදර කට්ටියට අමතරව තව දෙදෙනකුට රැකියා අවස්ථාවන් සලසා දෙන්නත් අද වෙන කොට මට පුළුවන් වෙලා තියෙනවා.''

කිච්ල් මොහොමඩ් ෆාරුක්
කරදිමුල්ල,
ගුරුතලාව.

කවරයේ කතාව

එච් එන් බී ග්‍රාමීන් ගෙනියන මේ වැඩසටහන

අපේ ජීවිත නගා සිටුවන්න විශාල පිටුවහලක් වුණා....

ජීවිතයට සතුට කැන්දන මල් අතමිට සරුකරන ව්‍යාපාරයක් බවට පත්වුනොත් එයින් ජීවිතයට සතුටයි අතට මුදලකුයි හරිහම්බ කරගන්න එක ඉතාම පහසුයි. ඒ විදිහට තමන් ජීවත්වන දේශගුණික වටපිටාවේ වාසියත් උදව්වට අරගෙන මල් වගාව ව්‍යාපාරයක් විදිහට දියුණු කරගත් ව්‍යාපාරික කාන්තාවක් විදිහට මංජුලා දිල්රුක්ෂිව හඳුන්වන්න පුළුවන්. තම සැමියත් සමඟ එකතු වී මීට වසර අටකට පමණ ඉහතදී තම ගෙවත්තේ ම සුළුවෙන් ආරම්භ කරන ලද මල්වගාව අද වන විට විශාල වපසරියක් පුරා විහිදුණු මල් වගාවක් ලෙස ව්‍යාප්ත කරන්නට මංජුලා සමත් වෙලා. එච් එන් බී ග්‍රාමීන් සමාගමේ අතහිත ඇතිව ඇය පැමිණි ඒ තෘප්තිමත් ගමන පිළිබඳව මංජුලා අප සමඟ පැවසුවේ මෙවැන්නක්.

"මුලින්ම ගෙදර වත්තෙ පර්චස් විස්සක වගේ කුඩා ඉඩ ප්‍රමාණයක අපි මේ මල් වගාව ආරම්භ කළේ කපුරු රෝස වගේ මල් වර්ග කිහිපයකින්. ව්‍යාපාරය කරගෙන යන අතරේ ඒක තිබුණු මට්ටමින් එහාට දියුණු කර ගන්න කිසියම් ණයක් ගැනීමේ උවමනාව ඇතිවුණා. ඒත් බැංකු වලින් ඉල්ලන ලියකියවිලි සම්පූර්ණ කරන්න බැරිවීම නිසා අපේ ඒ අදහස නිකංම පුස්සක් වුණා. ඔය අතරේ තමයි අපිට ග්‍රාමීන් සමාගම ගැන දැන ගන්න ලැබෙන්නේ. ඇප තියන්නේ නැතිව පහසුවෙන් ණය මුදලක් ගන්න ග්‍රාමීන් සමාගම නිසා අපිට පුළුවන් වුණා.මල් වගාව වර්ධනය කරගන්නත් කලින් තැනට අමතරව පර්චස් අසූවක ඉඩමක් අරන් අළුතින් තැනක අලුත් විදිහට මල් වගාව ආරම්භ කරන්නත් මේ වෙනකොට අපිට පුළුවන් වෙලා තියෙනවා.ඒ කටයුත්තටත් අපිට ග්‍රාමීන් සමාගමේ මූල්‍ය පහසුකම් ලබාගන්න පුළුවන් වුණා. ගැණුම්කාරයෝ අපි ළඟටම එන හින්දා වෙළෙඳපොළ ගැන ගැටළුවක් නැහැ.මේ වෙනකොට තව තුන්දෙනෙක් මා ළඟ රැකියාව කරනවා. මල් පැළ අවශ්‍ය තැන් වලට ගෙනියන්න අපේම ලොරියක් තියෙනවා.

දවසින් දවස ඉන්න තැනින් අඩියක් හරි ඉස්සරහට යන්න මිනිස්සු කැමතියි. වෙලා තියෙන්නෙ ඒ සඳහා අත දෙන්න එච් එන් බී ග්‍රාමීන් සමාගම වගේ ආයතන නැතිකම මේ රටින් දුප්පත්කම තුරන් කරන්න එච් එන් බී ග්‍රාමීන් සමාගම ගෙනියන මේ වැඩසටහන අපි වගේ උදවියගේ ජීවිත නගා සිටුවන්න විශාල පිටුවහලක් වුණා.

එච්. එම් මංජුලා දිල්රුක්ෂි
තොරණ හන්දිය, කැප්පෙටිපොළ



සිත්තර යාළු
පුංචි අපේ චිත්‍ර පිටුව

''සිත්තර යාළු'' චිත්‍ර පිටුව වෙන්වෙලා තියෙන්නේ එච් එන් බී ග්‍රාමීන් කාර්ය මණ්ඩලයේ ඔබේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළි දැක්වීම පිණිසයි. ''සිත්තර යාළු චිත්‍ර පිටුවෙහි පළවන චිත්‍ර අතරින් ඒ ඒ වයස් කාණ්ඩ අතරින් තෝරා ගනු ලබන හොඳම චිත්‍ර තුනක් සඳහා ත්‍යාග පිරිනැමීමටද අප බලාපොරොත්තු වන අතර ඔබගේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළිදක්වාලීමට ලැබෙන මේ මාහැඟි අවස්ථාව ප්‍රයෝජනයට ගෙන **ඔබේ දරුවාගේ චිත්‍ර නිර්මාණ සංස්කාරක, චිත්‍ර පිටුව, එච් එන් බී ග්‍රාමීන් ගොඩනැගිල්ල, අංක 168, නාවල පාර , නුගේගොඩ. යන ලිපිනයට නොපමාව යොමු කරන්න.**

ගම්මඩු දර්ශනයක්
එස්. එම්. ළහිරු නිර්මාල්
8 වසර
(එස්. එම්. මහේෂ් උදය
අම්බලන්ගොඩ.)

ගමක අසිරිය
සිතුම් ආලෝක ප්‍රනාන්දු
5 වසර
(රුවන් ප්‍රනාන්දු
ප්‍රධාන කාර්යාලය)

සරුංගල් යවන ළමයින්
මෙතායා හිමන්දි පෙරේරා
විල්ස්ඩන් ජාත්‍යන්තර පාසැල
1 ශ්‍රේණිය
(සුදේශ් පෙරේරා
ප්‍රධාන කාර්යාලය)

මගේ ගෙවත්ත
එම්.ටී. උතුල් බුද්මිණ තන්ත්‍රිගේ
මාම්පේ කනිෂ්ඨ විද්‍යාලය
1 ශ්‍රේණිය
(බුද්ධික තන්ත්‍රිගේ, ප්‍රධාන කාර්යාලය)

මගේ ගෙවත්ත
එස්. එම්. නිතිනි දිනෙත්මා
අවු. 04
(එස්. එම්. මහේෂ් උදය
අම්බලන්ගොඩ.)

අපේ පවුල
මිනුදි මන්දුලී එදිරිසිංහ
ධර්මාශෝක මහා විද්‍යාලය
1 වසර
(එම්.පී. එදිරිසිංහ, අම්බලන්ගොඩ)

ශිෂ්‍යත්වය දිනූ අපේ හපන්නු

2015 වසරේදී පැවැත්වු පහවසර ශිෂ්‍යත්ව විභාගයෙන් කඩඉම් ලකුණු ජයගෙන උසස් ලෙස ශිෂ්‍යත්වය සමත් වු දරුවන් අතර අප කාර්ය මණ්ඩලයේ නිළධාරින්ගේ දූ දරුවන් කිහිප දෙනකුම විය. පහත පළවනුයේ ශිෂ්‍යත්ව කඩඉම දිනූ එවන් අපේ දූ දරුවන් කිහිප දෙනකුගේ තොරතුරුය. **දුවේ.... පුතේ... ඔබ සියලු දෙනාගේ ඉදිරි අධ්‍යාපන කටයුතු තව තවත් සාර්ථක වේවායි එච් එන් බී ග්‍රාමීන් අපි මෙසේ ඔබට සුභාෂිංශන ගෙන එන්නෙමු.**

පි. එන්. සදිෂක නිම්ෂාන් ප්‍රනාන්දු
විභාග අංකය : 2919176
ලබාගත් ලකුණු : 160
භාරකරු : පි. සම්පත් ප්‍රනාන්දු
පුත්තලම ශාඛාව

එස්. සිතුම් ආලෝක ප්‍රනාන්දු
විභාග අංකය : 1526928
ලබාගත් ලකුණු : 165
භාරකරු : එස්. ඒ. රුවන් ප්‍රනාන්දු
ප්‍රධාන කාර්යාලය

ඒ. රොක්ෂිකා
විභාග අංකය : 4144465
ලබාගත් ලකුණු : 155
භාරකරු :කේ. අන්ටනි ජයරාජ්
ප්‍රධාන කාර්යාලය

තමා නිවැරදි විට අනුන් කෙතරම් දොස් නැගුවත් එයට කම් නැත.

Office එකට Accounts

- 01 කොටස -



බැංකු සසැඳුම් ප්‍රකාශය
(Bank Reconciliation Report)

එදිනෙදා ව්‍යාපාර කටයුතු කිරීමේදී චෙක්පත් මගින් ජංගම ගිණුම් හරහා ගනුදෙනු කිරීම අප ආයතනයේ ප්‍රධානම කාරණයක් වේ. එමෙන්ම එහි විනිවිද භාවය පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගැනීම ඉහළ කලමනාකාරීත්වයේ සිට සියළුම කළමනාකරුවන්ට සිය තීරණ ගැනීමට හා මූල්‍ය පාලනයට බෙහෙවින් උපකාරී වේ. එමෙන්ම අප ආයතනය විගණනය කරනු ලබන බාහිර හා අභ්‍යන්තර විගණක වරුන්ටද අප ආයතනයේ විමර්ෂණ අංශයටද (Investigation Department) අදාල ශාඛාවේ ගනුදෙනු වල විනිවිදභාවය සහ ක්‍රමවත් බව පිළිබඳව තීරණ ගැනීමට මෙම බැංකු සසැඳුම් ප්‍රකාශය (Bank Reconciliation Report) බෙහෙවින් ඉවහල් වේ.

➢ **බැංකු සැසඳුම් ප්‍රකාශය යනු**

ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය බැංකු ප්‍රකාශයේ ශේෂය සමග අසමාන වීමට හේතු පැහැදිලි කිරීම සඳහා පිළියෙල කරන ප්‍රකාශය බැංකු සසැඳුම් ප්‍රකාශයයි.

➢ **බැංකු සසැඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේ අවශ්‍යතාව**

බැංකු ගිණුමේ ශේෂය නිවැරදි කළ පසු බැංකු ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය (Bank statement) ඉන්පසුත් නොගැලපෙන්නේ නම් එය ගැළපීම බැංකු සසැඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේ අවශ්‍යතාවයයි. මෙයට අමතරව බැංකු සසැඳුම් ප්‍රකාශයක් පිළියෙල කිරීමෙන් සපුරාගත හැකි අවශ්‍යතා පහත දැක්වේ.

(01) චෙක්පත් මගින් සිදුවී ඇති වංචා හා අක්‍රමිකතා සොයා ගැනීම.

(02) බැංකුව විසින් සිදුකරන ලද වැරදි සොයාගෙන ඒවා නිවැරදි කිරීමට දැනුම් දීම.

(03) විගණන කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීම.

➢ **බැංකු ප්‍රකාශය (Bank statement)**

බැංකුවක් සිය ජංගම ගිණුම් හිමියන්ට ඔවුන්ගේ ජංගම ගිණුමේ විස්තර අඩංගු කරමින් එවනු ලබන මාසික වාර්තාව බැංකු ප්‍රකාශය හෙවත් බැංකු ගිණුම් විස්තරය ලෙස හැඳින්වේ.

➢ **බැංකු ප්‍රකාශයක පහත සඳහන් කරුණු ඇතුලත් වේ.**

★ කාල පරිච්ඡේදය ආරම්භයේ ශේෂය හා කාල පරිච්ඡේදය අවසානයේ ශේෂය (Opening & Closing Balance).

★ ව්‍යාපාරිකයා හෝ වෙනත් පාර්ශවයන් විසින් සිය ජංගම ගිණුමට තැන්පත් කරන මුදල්. (Cash Deposits)

★ ජංගම ගිණුමට තැන්පත් කර නිෂ්කාශනය වූ චෙක්පත (Cheque Deposits).

★ නිකුත් කර ගෙවීම සඳහා ඉදිරිපත් කළ චෙක්පත් (Issued Cheque).

★ ස්ථාවර (නිත්‍ය) නියෝග මත බැංකුව විසින් ව්‍යාපාරිකයා වෙනුවෙන් කරන ලද ගෙවීම් (Standing Order).

★ බැංකුව අයකරන ලද බැංකු ගාස්තු, බැංකු පොළී, චෙක්පොත් ගාස්තු, කොමිස් ආදිය හා ජංගම ගිණුමේ සිදුවී ඇති වැරදි ගැලපීම් (Bank Charges).

සඳකැලුම් ජයතුංග,
ගණකාධිකාරී,
එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්.

... 7 පිටුවෙන්

ඒ නිසා අධ්‍යාපනයට යෙදෙව්වේ අඩු කාලයක්.ආපහු ඒ අතීතයට යන්න පුළුවන් නම් මට ඉටුකරගත නොහැකිවුණු මගේ බලාපොරොත්තු ඉටුකර ගන්න පුළුවන් වේවි.

ජීවිතයට අහිමි වුණු වටිනාම පුද්ගලයා හෝ අවස්ථාව :- මගේ පළවෙනි බබා මව් කුසයේදීම මාස දෙකහමාරෙන් නැති වුණා. ඒ අවස්ථාවේ බිරිඳගේ ජීවිතය පවා අනතුරේ තිබුණේ. ඒ දරුවත් හිටියානම් කියන දුක තවමත් මගේ හිතේ තියෙනවා.

හරි ගස්සා ගන්න අවස්ථාවක් ලැබුනොත් ඔබ වෙනස් කරගන්නා ඔබේ දුර්වලතා :- මම ඕනවට වඩා මිනිස්සුන්ව විශ්වාස කරනවා.ඒ නිසා අමාරුවේ වැටුණු අවස්ථා වැඩියි. අනෙක කේන්තිත් යනවා.ඒ තත්වය පාලනය කර ගැනීමට හැකි උපරිමයෙන් උත්සාහ කරනවා.

ඔබ හිතන විදිහට ඔබ වඩාත්ම කුසලතාවන් ප්‍රකට කරන්නේ:- ව්‍යාපාරික කටයුතු වලට මගේ දක්ෂතාවක් තියෙනවා.තාත්තා අසනීප වුණාට පස්සේ හත අට පන්තිවලදි මම ගමේ ඇවිදලා අපේ කඩේට පොල් තැඹිලි හොයාගෙන ඇවිත් විකුණුවා. හරියට ගණන් හිලව් බේරන්නවත් දැනුමක් නැතිකාලේ ගණන් පොත්වල ලියාගෙන කඩේ සෑහෙන මට්ටමකට දියුණු කරන්න මට පුළුවන් වුණා.

ඔබේ ජීවිතයේදී හමුවූ වඩාත්ම ආකර්ශනීය පුද්ගලයා, ඔහුතුළ ඔබ දකින සුවිශේෂීතාවය :- මගේ අම්මා.අපි හුඟක් ආර්ථික ප්‍රශ්න වලට මුහුණ දුන්නු කාලේ අපේ අම්මා ගෙවල්වල, හෝටල්වල උයලා, ගල් වලවල්වල ගල් කඩලා අපිව ජීවත් කරවන්න නොසෑහෙන්න දුක් වින්දා අම්මාගේ ධෛර්ය හා ශක්තිය තමයි අපිව මේ තැනට ගෙනාවේ.

පළමු ආදර අත්දැකීම ජීවිතයට බලපෑ අන්දම :- ඉස්කෝලෙ යනකාලෙ 10 පන්තියෙදිත් 12 පන්තියෙදිත් ආදරය පිළිබඳ මූලික අත්දැකීමක් මම ලැබුවා. හැබැයි ඒ දෙකම ප්‍රතික්ෂේපිත ඒකපාර්ශ්වීය ආදර සම්බන්ධතා දෙකක්.ඉන් පස්සෙ තමයි මගේ බිරිඳව මට හම්බවුණේ. අපි එකට උසස්පෙළට පන්ති ගියේ.ඒත් එතකොට අපි අතරෙ තිබුණෙ මිත්‍රත්වයක් විතරයි.එයා හෙද විද්‍යාලයෙ ඉන්න කාලේ තමයි මිත්‍රත්වය ආදරයක් බවට පෙරළුනේ. අවුරුදු අටක් ආදරය කරලා අපි විවාහ වුණා.

එම පුද්ගලයාගේ ඔබ දකින සුවිශේෂතාව :- ඇය සුමුදු කාංචනා. ආදරණීය බිරිඳක්

ඔබ ඔබේ ජීවිතය ගැන තෘප්තිමත්ද :- අනිවාර්යයෙන්ම.හරියට ගෙයක් කියලා කියන්න පුළුවන් ගෙයක් නෙවෙයි අපිට තිබුණේ.කාමර දෙකක් විතරක් තිබුණු ඒ ගෙදර අපි පස්දෙනාම නිදාගත්තේ බිම. මම 2006 ඉඩමක් අරන් 2008 දී ගෙයක් හදන්න පටන් ගත්තා.2012 දී ගේ හදලා ඉවරයි. 2013දී වාහනයක් ගත්තා.මේ කාලය තුළ මගේ ඉලක්ක වලින් 75% සම්පූර්ණ කරගන්න මට පුළුවන් වුණා. ඒ හැමදේම මම කළේ මේ රස්සාවෙන්.ඉතින් මට මම ගැන තෘප්තිමත් වෙන්න පුළුවන්.

ඔබේ ජීවිතය වෙනස් කළ හැරවුම් ලක්ෂ්‍යය (Terning Point):-2004 දි මම ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වීම. ඒ වෙද්දි මම සෙලින්කෝ රක්ෂණ සමාගමේ මාසයේ හොඳම නියෝජිතයා විදිහට මාස තුනක්ම ඇගයීමට ලක්වෙලයි හිටියේ. ඒත් ග්‍රාමීන් එකට එන්න අවස්ථාවක් ලැබුණාම දෙපාරක් නොසිතා මම ග්‍රාමීන් එක තෝරා ගත්තා.

ඔබේ ප්‍රියතම ගායකයා :- කසුන් කල්හාර

ගීතය :- කසුන්ගේ “මල් මිටක් තියන් ඔබ අතේ”

චිත්‍රපටිය :- ඉංග්‍රීසි ක්‍රියාදාම චිත්‍රපටිවලට වඩාත් කැමතියි

කෘතිය :- චින්තා ලක්ෂ්මි මහත්මිය සිංහලට පරිවර්තනය කරපු ''අරණකට පෙම්බැඳ''

අනාගත ඉලක්කය :- කාටවත් කරදරයක් නොවී දෙමව්පියන්ට දරුවන්ට සහ බිරිඳට සලකගෙන සතුටින් ජීවත්වීම.❑

ආත්ම විශ්වාසය නැති තැන උපදින්නේ බිය හා සැකයයි.

ඔබේ වාහනය යම් අනතුරකට මුහුණ දුන් විට

නිරන්තරයෙන් වාහන සමග මුහුවුණු රාජකාරී ජීවිතයේදී ඔබ මගතොට අනතුරු වලට මුහුණ දෙන අවස්ථා විරල නැහැ. මගතොට එවන් අනතුරකට මුහුණ පෑමට සිදුවුවහොත් ඔබ අනුගමනය කළයුතු කියාමාර්ග පිළිබඳ යම් දැනුවත් බවක් ඔබ තුළ වේනම් නීතිමය පැත්තෙන් සිදුවන අනවශ්‍ය රස්තියාදු හැකිතාක් මග හරවා ගැනීමට ඔබට හැකිවේවි. ජීවිතයට නීතිය තුළින් අපි අද කතා කරන්නේ ඒ ගැනයි.

මෙහිදි බලපාන්නේ 1948 අංක 40 දරණ මෝටර් වාහන පනත වන අතර එහි 161 වන වගන්තිය මගින් මෙවැනි අවස්ථාවකදි අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය පිළිබදව දැක්වේ.

- රථයේ රියදුරා විසින් වාහනය වහාම නතර කළ යුතුය.
- බරපතල තත්වයේ යම් අයෙකු පසුවේ නම් වහාම ඔවුන් රෝහල කරා ගෙන යා යුතුය.
- පසුව පොලිසිය වෙත අනතුර වාර්තා කළ යුතුය.
- එම අවස්ථාවේ අනතුර පොලිසිය වෙත වාර්තා කිරීමට නොහැකි වූවේ නම් පැය 24 ඇතුළත එය වාර්තා කළ යුතුවේ.
- රථයේ අයිතිකරු පිළිබදව විස්තර පොලිසිය විසින් ඉල්ලා සිටින විටදි එකී විස්තර ලබා දීම අනිවාර්ය වේ. එම අවස්ථාවේදි රක්ෂණ සහතිකය ආදායම් බලපත්‍රය ලබාදීමට නොහැකි වුවහොත් පැය 24 ඇතුළත ළගම ඇති පොලිසියට එය ලබාදීම අවශ්‍ය වේ.
- කෙසේ වෙතත් අනතුරින් සිදුවන හානි පූරණය සදහා තම රක්ෂණ නිලධාරියා දැනුවත් කිරීම අවශ්‍ය වන අතර බොහෝවිට රක්ෂණාවරණය මගින් හානිය අවම කර ගැනීමට හැකියාව ඇත.

තවද ඔබ මාර්ගයේ ධාවනය කරන විට යම් වරදක් සම්න්ධයෙන් පොලිස් නිලධාරීන් ඔබගේ වාහනය නතර කරන විට එම ස්ථානයේ නිලධාරීන් අවම වශයෙන් දෙදෙනෙකු රාජකාරියේ යෙදී සිටිය යුතු වන අතර එය නඩුවකදි සාක්ෂියක් වීමේ පහසුව සදහා භාවිතා වන්නකි.

ඔබ තනි ඉර කපමින් ධාවනය කරන විට එම ස්ථානයේම අවම වශයෙන් රු.1000/- දඩයක් නියම කළ හැකි අතර ඉරි දෙකම කපා ධාවනය කරන විට ඒ සදහා උසාවිය වෙත යොමු කිරීම සිදුවේ. ආදායම් බලපත්‍රයක් නොමැතිව ධාවනය කරන විට දඩකොළයක් ලබාදිය හැකි අතර රු.3,000 අවම දඩයක් අධිකරණය මගින් නියම කළ හැකිය. රක්ෂණාවරණයක් නොමැති විට අනිවාර්යෙන් අධිකරණය වෙත ඉදිපරිත් කරන අතර අවම දඩය රු.5,000/- ක් පමණ වේ. තවද බීමතින් ධාවනය කර ඇති විට අවම දඩය රු.3500 ක් වන අතර අධිකරණය මගින් රියදුරු බලපත්‍රය යම් කාලයකට අවලංගු කරනු ඇත. කෙසේ වෙතත් යම් වරදකරුවකු වරද පිළිගන්නේ නම් අධිකරණය මගින් අවම දඩුවම/දඩය නියම කළයුතු වුවත් ඒ ඒ අධිකරණයේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය මත එකී දඩය/දඩුවම වෙනස් විය හැක.

- නීතිඥ දිනේෂ් රත්නසේකර

පැඩි පත

"ඇඟිලි තුඩු ගැන ගැන
සිත සිතුම් පොදි බැඳ
ආදරෙන් අතට ගන්නටත් පෙර...
කොටස් ලෙස වෙන් කර
වෙන වෙන අයට
පිදුවෙමි...

ඊ. චන්න දයාප්‍රිය
අම්බලන්ගොඩ ශාඛාව

HNB GRAMEEN මෙහෙවර
එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්
නො :168 නාවල පාර
නුගේගොඩ
ටෙලි : 0112176262 ෆැක්ස් ෑ 0112825843
ඊ-මේල් :- manjula.p@hnbgrameen.lk
වෙබ් :- www.hnbgrameen.com
අධික්ෂණය :- චමින්ද ප්‍රභාත්
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි
ප්‍රධාන කර්තෘ :- මංජුල ප්‍රභාත් හෙට්ටි ආරච්චි
පිටු සැලසුම් :- චින්තක (අර්ජුන ග්‍රැෆික්ස්)
ඡායාරූප ශිල්පි :- ලක්ෂ්මන් කුමාරතුංග

Happy Birthday

නොවැම්බර් මාසයේ උපන්දිනය සමරන
එච් එන් බී ග්‍රාමීන් සමාගමේ සහෝදර සේවක මහත්ම මහත්මීන් වෙත
අපගේ හෘදයාංගම සුබ පැතුම් මේ සමග පිරිනමමු !

නම	දිනය	ශාඛාව
ප්‍රදීප් කුමාර ජයවර්ධන මහතා	නොවැ. 01	නාවලපිටිය
මොහොමඩ් සෆ්රාස් මහතා	නොවැ. 01	පොතුවිල්
ලහිරු ප්‍රනීත් මහතා	නොවැ. 01	ගම්පහ
සංජීව චතුරංග මහතා	නොවැ. 02	නගර ශාඛාව
ජේ සුයන්ත් මහතා	නොවැ. 03	වවුනියා
එම් ප්‍රසාත් මහතා	නොවැ. 03	මුලතිව්
මධුශංක දිසානායක මහතා	නොවැ. 03	මතුගම
දමින්ද රත්නායක මහතා	නොවැ. 03	පදවිය
ප්‍රශාන්ත සම්පත් මහතා	නොවැ. 03	පුත්තලම
ජී තිලකරත්න මහතා	නොවැ. 04	නිකවැරටිය
එරංද බුද්ධික මහතා	නොවැ. 04	පොළොන්නරුව
සඳරුවන් ජයරත්න මහතා	නොවැ. 05	නාවලපිටිය
නඩරාජ් සුරේෂ් මහතා	නොවැ. 05	වවුනියා
කෝකිලා සංජීවනී මෙනෙවිය	නොවැ. 05	දඹුල්ල
කේ. පරමේෂ්වරන් මහතා	නොවැ. 05	නෙල්ලිඅඩි
විලාන් අංජන මහතා	නොවැ. 05	අම්බලන්ගොඩ
සුදේශ් පෙරේරා මහතා	නොවැ. 06	ප්‍රධාන කාර්යාලය
ප්‍රදීප් ක්‍රිශාන්ත මහතා	නොවැ. 06	නගර ශාඛාව
කුමාර විතානගේ මහතා	නොවැ. 06	හම්බන්තොට
රජිත පෙරේරා මහතා	නොවැ. 06	මොරටුව
රසික ශාන්ත මහතා	නොවැ. 06	මොරවක
ජේ. නිරෝෂන් මහතා	නොවැ. 06	වවුනියා
කුමාර රත්නායක මහතා	නොවැ. 07	ගාල්ල
සමීර සම්පත් මහතා	නොවැ. 07	නිකවැරටිය
චමෝද් අනුරාධ මහතා	නොවැ. 07	නිට්ටඹුව
ගයාන් උදයලාල් මහතා	නොවැ. 07	ගම්පහ
ධනුෂ්ක චතුරංග මහතා	නොවැ. 08	නගර ශාඛාව
චමිත් යසින්ත මහතා	නොවැ. 08	මතුගම
චමිල හර්ෂප්‍රිය මහතා	නොවැ. 09	බණ්ඩාරගම
චමින්ද දිසානායක මහතා	නොවැ. 09	ගල්ගමුව
අජිත් කරුණාරත්න මහතා	නොවැ. 09	පොළොන්නරුව
ඉඳුනිල් කුමාරී මෙනෙවිය	නොවැ. 09	නිකවැරටිය
එස් යාලකන් මහතා	නොවැ. 09	නෙල්ලිඅඩි
සජිත් ප්‍රියංකර මහතා	නොවැ. 09	අවිස්සාවේල්ල
රංදිම මධුශංඛ මහතා	නොවැ. 09	ඇඹිලිපිටිය
චන්දන කුමාර මහතා	නොවැ. 10	මතුගම
සහන් මධුරංග මහතා	නොවැ. 10	නිට්ටඹුව
නිලන්ත රත්නායක මහතා	නොවැ. 11	ගල්ගමුව
ශෂී දුමින්ද මහතා	නොවැ. 11	කන්තලේ
එන්. අරවින්දන් මහතා	නොවැ. 11	නෙඩුන්කේනි
චානක ජයතිස්ස මහතා	නොවැ. 12	මොරටුව
ඉංදික බණ්ඩාර මහතා	නොවැ. 12	පොළොන්නරුව
සමීර ප්‍රසන්ගීත් මහතා	නොවැ. 12	හෝමාගම
සුරේෂ් සේනානායක මහතා	නොවැ. 12	ජා-ඇල
නිශානී මධුෂ්කා මෙනෙවිය	නොවැ. 13	හෝමාගම
ඒ ඩී එම් අනුරුද්ධික මහතා	නොවැ. 13	පදවිය
ධනුෂ්ක මධුරංග මහතා	නොවැ. 13	මොනරාගල
එස්.උලකේෂ්වරන් මහතා	නොවැ. 13	මඩකලපුව
දිල්රුවන් කෝසල මහතා	නොවැ. 13	මහියංගනය
චන්දන ගයාන් මහතා	නොවැ. 14	වත්තල
ශානක නිරෝෂන් මහතා	නොවැ. 14	ප්‍රධාන කාර්යාලය
තුෂාර තිළිණ මහතා	නොවැ. 15	හම්බන්තොට
ආර් ඒ ප්‍රභාත් මහතා	නොවැ. 15	පොළොන්නරුව
චතුරංග මහේෂ් මහතා	නොවැ. 15	මැදවච්චිය
නුවන් මධුශංක මහතා	නොවැ. 15	හොරණ
රුවන් සම්පත් මහතා	නොවැ. 15	බණ්ඩාරගම
සාරක මාඩිවිල මහතා	නොවැ. 15	මාතර
මිලාන් ශාමික මහතා	නොවැ. 16	අම්බලන්ගොඩ
නිමේශ් ප්‍රනාන්දු මහතා	නොවැ. 16	මොරටුව
මංජුල ගමගේ මහතා	නොවැ. 16	නොච්චියාගම
නෙවිල් සෙල්ව කුමාර් මහතා	නොවැ. 16	නොරොච්චෝලෙ
අරුණ වසන්ත මහතා	නොවැ. 17	ප්‍රධාන කාර්යාලය
කේ විනයාගමූර්ති මහතා	නොවැ. 17	වවුනියා
ගමගේ නිමල්සිරි මහතා	නොවැ. 17	හම්බන්තොට
ශානිකා මධුශානී මෙනෙවිය	නොවැ. 17	හොරණ
කසුන් කල්හාර මහතා	නොවැ. 17	කළුතර
ජයන්ත වීරසිංහ මහතා	නොවැ. 18	මහියංගනය
ප්‍රදීප් රත්නායක මහතා	නොවැ. 18	හෝමාගම
පී සන්ශීත් මහතා	නොවැ. 18	අම්පාර
අසාන් ජයසංක මහතා	නොවැ. 18	හෝමාගම
හසංක මධුරංග මහතා	නොවැ. 18	නගර ශාඛාව
චමින්ද ප්‍රදීප් මහතා	නොවැ. 19	ඇඹිලිපිටිය
සුරාජ් මධුශංක මහතා	නොවැ. 19	බෙලිඅත්ත
චන්දු වීරසිංහ මහතා	නොවැ. 19	රත්නපුර
ධර්මාශෝක ඩි සිල්වා මහතා	නොවැ. 20	අම්පාර
මිථිල පෙරේරා මහතා	නොවැ. 20	ප්‍රධාන කාර්යාලය
මංජුල හෙට්ටිආරච්චි මහතා	නොවැ. 21	ප්‍රධාන කාර්යාලය
තිළිණ සම්පත් මහතා	නොවැ. 21	පිටිගල
ප්‍රදීප් ධර්මසේන මහතා	නොවැ. 22	අම්බලන්ගොඩ
සාරානාත් අමරසිංහ මහතා	නොවැ. 22	ප්‍රධාන කාර්යාලය
දිල්ෂාන් ලක්ෂිත මහතා	නොවැ. 22	නිට්ටඹුව
සංජය උපුල් බණ්ඩාර මහතා	නොවැ. 23	ප්‍රධාන කාර්යාලය
උදාර සම්පත් මහතා	නොවැ. 23	දඹුල්ල
ප්‍රදීප් ඒකනායක මහතා	නොවැ. 24	ගල්ගමුව
පැතුම් සම්පත් කුරේ මහතා	නොවැ. 25	ප්‍රධාන කාර්යාලය
සනත් උදය බණ්ඩාර මහතා	නොවැ. 25	ප්‍රධාන කාර්යාලය
සුදත් වීරසිංහ මහතා	නොවැ. 25	ඇඹිලිපිටිය
පී මයුරන් මහතා මහතා	නොවැ. 25	කන්තලේ
නදීශා ලක්මාලී මෙනෙවිය මහතා	නොවැ. 25	කළුතර
පී.රවීවර්මන් මහතා	නොවැ. 25	කල්මුණේ
සුනේන්ද්‍ර මධුසංග මහතා	නොවැ. 26	ප්‍රධාන කාර්යාලය
චතුරංග මධුශාන් මහතා	නොවැ. 26	කඩුවෙල
ප්‍රභානී වීරරත්න මෙනෙවිය	නොවැ. 26	ප්‍රධාන කාර්යාලය
චතුර නුවන් මහතා	නොවැ. 26	බදුල්ල
සචිත් විරංග මහතා	නොවැ. 27	දඹුල්ල
චන්දන රණසිංහ මහතා	නොවැ. 28	කුරුණෑගල
රංග ගුණසේකර මහතා	නොවැ. 28	බණ්ඩාරගම
හෂාන් ඉංදික මහතා	නොවැ. 28	බදුල්ල
තිළිණ රුවන් මහතා	නොවැ. 28	අම්බලන්ගොඩ
එස්. බනූජ මහතා	නොවැ. 28	වවුනියා
සඳුන් කුමාර මහතා	නොවැ. 28	අම්බලන්ගොඩ
කාංචන බෙලිකුඹුර මහතා	නොවැ. 29	ප්‍රධාන කාර්යාලය
දිනේෂ් වාසුල මහතා	නොවැ. 29	කෑගල්ල
චතුර නදීශාන් මහතා	නොවැ. 29	කුලියාපිටිය
රජිත පෙරේරා මහතා	නොවැ. 29	වෙන්නප්පුව
අසේල සමුද්දික මහතා	නොවැ. 30	දඹුල්ල

කොන්දේසි විරහිතව ආදරය කිරීම තරම් දෙයක් මේ ලොව නැතිතරම්ය.